# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## බැංකු (සංශෝධන)

**1988 අංක 30 දරන බැංකු පනත සංශෝධනය කිරීම සඳහා** වූ
පනත් කෙටුම්පතකි

---

මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමා විසින්
2024 පෙබරවාරි මස 21 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2024 පෙබරවාරි මස 06 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[242 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල **:** රු. 78.00 තැපැල් ගාස්තුව **:** රු. 150.00

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## නීතිය බලපෑමේ ප්‍රකාශය

***2 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1988 අංක 30 දරන බැංකු පනතේ 2 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ එම වගන්තියේ කාර්ය සඳහා "සමාගම" යන අර්ථ නිරූපණයෙන් ෂෙල් බැංකුව බැහැර කිරීම වේ.

***3 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට 2අ වන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, එම නව වගන්තියේ නීතියේ බලපෑම වනුයේ බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කිරීමට සමාගමක් සතු විය යුතු අවම බලපත්‍ර දීමේ නියමයන් සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

***4 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ එම වගන්තියේ කාර්යය සඳහා ඉල්ලුම්පත් ගාස්තුවක් සහ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට සමාගමකට නියම කිරීම වේ.

***5 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කරන ලද සමාගම් සහ සංස්ථාපිත මණ්ඩල විසින් බැංකු ව්‍යාපාර ශ්‍රී ලංකාව තුළ ආරම්භ කිරීමට අදාළව මුදල් මණ්ඩලය විසින් ඉටු කරනු ලැබිය යුතු කර්තව්‍ය මහ බැංකුව වෙත පැවරීම වේ.

***6 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ මෙරට බැංකු ව්‍යාපාර සහ අක්වෙරළ බැංකු ව්‍යාපාර අතර පවත්නා සීමාව ඉවත් කිරීම පිළිබඳ සැලකිල්ලට ගනිමින් මෙරට බැංකු ව්‍යාපාර සහ අක්වෙරළ බැංකු ව්‍යාපාර යන යෙදුම්වලට ඇති සඳහන ඉවත් කිරීම වේ.

***7 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා විසින් බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් ගෙවිය යුතු වාර්ෂික බලපත්‍ර ගාස්තුව පිළිබඳ දැනුම් දීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

***8 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් බුන්වත්භාවයට පත්ව ඇත්නම් සහ ඊට විරුද්ධව ගණන් බේරා වසා දැමීම පිළිබඳ නඩු කටයුතු ආරම්භ කර ඇත්නම්, එම බැංකුවේ බලපත්‍රය අවලංගු කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

***9 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ 2023 අංක 17 දරන බැංකු (විශේෂ විධිවිධාන) පනතේ විධිවිධාන මගින් යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක අනිවාර්ය ඈවර කිරීම සම්බන්ධයෙන් විධිවිධාන සලස්වා ඇති බැවින්, එම පනතේ විධිවිධානවල අදාළත්වය සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම වේ.

***10 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ -

(අ) එම වගන්තියේ නිශ්චිතව දක්වා ඇති ගනුදෙනු සිදු කිරීම සඳහා අමාත්‍යවරයාගේ එකඟත්වය ලබා ගැනීමේ නියමය ඉවත් කිරීම වේ;

(ආ) ශ්‍රී ලංකාවෙන් පිටත යම් ස්ථානයක යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක ශාඛාවක් හෝ නියෝජිත කාර්යාලයක් විවෘත කිරීමට, වසා දැමීමට හෝ වෙනත් ස්ථානයකට ගෙන යාමට අමාත්‍යවරයාගෙන් විමසීම සඳහා නියම කිරීම වේ;

(ඈ) බලපත්‍රලාභී මුදල් සමාගමක් හෝ බලපත්‍රලාභී මුදල් සමාගමක ව්‍යාපාරයක කොටසක් හෝ අත්පත් කර ගැනීමේ හෝ බැංකුවක ව්‍යාපාර සියල්ලම හෝ ඉන් කොටසක් විකිණීමේ හැකියාව බලපත්‍රලාභී වාණිජ බැංකුවකට හඳුන්වා දීම වේ;

(ඈ) ශ්‍රී ලංකාව තුළ නියෝජිත කාර්යාල විවෘත කිරීමේ අපේක්ෂාව ඇති විදේශ බැංකු විසින් ගෙවිය යුතු, මහ බැංකුව විසින් නිශ්චය කරනු ලබන පරිදි වූ ඉල්ලුම්පත් ගාස්තුවක් සඳහා විධිවිධාන සැලැස්වීම වේ;

(ඉ) බලපත්‍රලාභී මුදල් සමාගමක් සමඟ එක් කිරීමට හෝ ඒකාබද්ධ කිරීමට බලපත්‍රලාභී වාණිජ බැංකුවකට හෝ එහි ශාඛාවකට අවසර ලබා දීම;

(ඊ) බලපත්‍රලාභී වාණිජ බැංකුවක් හෝ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් විසින් මහ බැංකුවේ නියාමනයට හෝ අධීක්ෂණයට යටත් වන්නා වූ වෙනත් මුදල් ආයතනයකට ව්‍යාපාර හෝ ව්‍යාපාරවලින් කොටසක් අත්කර ගැනීමට හැකියාව ලබා දීම මගින් එම වගන්තියේ (1) වන උපවගන්තියට (ඊ) වන අලුත් ඡේදය හඳුන්වා දීම වේ;

(උ) අවස්ථාවෝචිත පරිදි, එම වගන්තියේ (1ඇ) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කර ඇත්තා වූ යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් හෝ පුද්ගලයකු, හවුල් ව්‍යාපාරයක් හෝ සංස්ථාපිත මණ්ඩලයක් විසින් අදාළ බලපත්‍රලාභී වාණිජ බැංකුවේ වැදගත් අයිතිවාසිකමක් ඉක්මවමින් අත්පත් කර ගෙන ඇති කොටස් බැහැර කිරීම හෝ විකිණීම සිදු කරන ලෙස එම බලපත්‍රලාභී වාණිජ බැංකුවට, පුද්ගලයාට, හවුල් ව්‍යාපාරයට හෝ සංස්ථාපිත මණ්ඩලය විධාන කිරීම සඳහා මහ බැංකුවට හැකියාව ලබා දීම වේ; සහ

(ඌ) වැදගත් අයිතිවාසිකම අත්පත් කර ගැනීම් උල්ලංඝනය කර ඇති අවස්ථාවල දී මහ බැංකුව විසින් ගනු ලැබිය හැකි ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම වේ.

***11 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය යටතේ ප්‍රදානය කරන ලද අනුමතයන් අස්කර ගැනීම සම්බන්ධයෙන් වන අවස්ථාවල දී අමාත්‍යවරයාගේ අනුමතය ලබා ගැනීමේ නියමය ඉවත් කිරීම වේ.

***12 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ බලපත්‍රලාභී වාණිජ බැංකුවට හෝ එහි බැංකු සමූහය වෙත සේවා සපයනු නොලබන මූල්‍ය නොවන පාලිත සමාගම්වල හිමිකාරිත්වය විකිණීම සඳහා බලපත්‍රලාභී වාණිජ බැංකුව වෙත නියම කිරීම සහ එවැනි මූල්‍ය නොවන පාලිත සමාගම්වල පවතින බැංකුවේ කොටස් දැරීම බැහැර කිරීම සඳහා අවුරුදු පහක අන්තර්කාලීන කාලසීමාවක් ප්‍රදානය කිරීම වේ.

***13 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ -

(අ) බලපත්‍රලාභී වාණිජ බැංකුවක ස්කන්ධ ප්‍රාග්ධනය වැඩි කර ගැනීමට එම බලපත්‍රලාභී වාණිජ බැංකුවක් වෙත නියම කර ඇති කාලසීමාව මාස දොළහක් දක්වා හෝ මහ බැංකුව විසින් නිශ්චය කරනු ලබන පරිදි වෙනත් යම් කාලසීමාවක් දක්වා වෙනස් කිරීම හෝ මහ බැංකුව විසින් ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය වෙනස් කිරීම හේතුවෙන් සෑම බලපත්‍රලාභී වාණිජ බැංකුකම ස්කන්ධ ප්‍රාග්ධනය වැඩි කර ගැනීමට එම බලපත්‍රලාභී වාණිජ බැංකුවල වෙත නියම කර ඇති කාලසීමාව මාස දොළහක් දක්වා හෝ මහ බැංකුව විසින් නිශ්චය කරනු ලබන පරිදි වෙනත් යම් කාලසීමාවක් දක්වා වෙනස් කිරීම; සහ

(ආ) යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක ව්‍යාපාරවල දී ඇති විය හැකි විශේෂ අවදානම් තත්ත්වයන් සැලකිල්ලට ගනිමින් සුදුසු පරිදි අතිරේක ප්‍රාග්ධනයක් පවත්වාගෙන යාම සඳහා එම බලපත්‍රලාභී වාණිජ බැංකුව වෙත නියම කිරීම වේ.

*14 වන වගන්තිය:* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ -

(අ) නියාමන අවශ්‍යතාවන්ගේ වර්ධනය පිළිබඳ සැලකිල්ලට ගනිමින් මහ බැංකුව විසින්, කලින් කල, නිශ්චය කරනු ලැබිය හැකි පරිදි බලපත්‍රලාභී වාණිජ බැංකුවල වගකීම් සපුරාලීම සඳහා එම බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් ද්‍රවශීල වත්කම් පවත්වාගෙන යෑමේ නියමයන් සඳහා විධිවිධාන සැලැස්වීම; සහ

(ආ) බලපත්‍රලාභී වාණිජ බැංකුවක වගකීම් සපුරාලීම සඳහා එම බලපත්‍රලාභී වාණිජ බැංකුව විසින් පවත්වාගෙන යෑමට නියමිත අතිරේක ද්‍රවශීල වත්කම් නිශ්චය කිරීම සඳහා වූ මහ බැංකුවේ හැකියාව හඳුනාගැනීම සහ මහ බැංකුව විසින් නිශ්චය කරනු ලබන පරිදි එවැනි වත්කම් පවත්වාගෙන යෑම සඳහා බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත නියම කිරීම වේ.

*15 වන වගන්තිය:* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ බලපත්‍රලාභී වාණිජ බැංකුවල ලාභාංශ ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධයෙන් විධාන නිකුත් කිරීම සඳහා මහ බැංකුවට හැකියාව ලබා දීම වේ.

*16 වන වගන්තිය:* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට 22අ වන අලුත් වගන්තියක් ඇතුළත් කරනු ලබන අතර එම නව වගන්තියේ නීතියේ බලපෑම වනුයේ අක්වෙරළ බැංකු ව්‍යාපාර කර ගෙන යෑමේ කාර්යය සඳහා විදේශ ව්‍යවහාර මුදල් නම් කිරීමට මහ බැංකුවට හැකියාව ලබා දීම වේ.

*17 වන වගන්තිය:* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ IV වන කොටස ඉවත් කරනු ලබන අතර එය 6 වන වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සඳහා කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

*18 වන වගන්තිය:* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 35 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ තනි සහ ඒකාබද්ධ පදනම යන දෙකම මත මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් වෙත නියම කිරීම වේ.

*19 වන වගන්තිය:* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 36 වන වගන්තිය ඉවත් කරනු ලබන අතර එය 18 වන වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 35 වන වගන්තියට කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

*20 වන වගන්තිය:* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තිය ඉවත් කරනු ලබන අතර එය 18 වන වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 35 වන වගන්තියට කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

*21 වන වගන්තිය:* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ ශ්‍රී ලංකාව ඇතුළත සංස්ථාගත කරන ලද බලපත්‍රලාභී වාණිජ බැංකුවක මුදල් වර්ෂය අවසන් වීමේ දින සිට මාස තුනක් ඇතුළත එම බලපත්‍රලාභී වාණිජ බැංකුව විසින් තනි සහ ඒකාබද්ධ පදනම් මත ස්වකීය විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා වෙත සම්ප්‍රේෂණය කරන ලෙස එම බලපත්‍රලාභී වාණිජ බැංකුව වෙත නියම කිරීම සහ ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කරන ලද යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක මුදල් වර්ෂය අවසන් වීමේ දින සිට මාස තුනක් ඇතුළත එම බලපත්‍රලාභී වාණිජ බැංකුව

විසින් ශ්‍රී ලංකාව ඇතුළත සිදු කළ ස්වකීය ව්‍යාපාර සම්බන්ධයෙන් එහි විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා වෙත සම්ප්‍රේෂණය කරන ලෙස එම බලපත්‍රලාභී වාණිජ බැංකුව වෙත නියම කිරීම සහ එම මූල්‍ය ප්‍රකාශන අදාළ බැංකුවේ නිල වෙබ් අඩවියෙහි පළ කරන ලෙස නියම කිරීම වේ.

***22 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 39 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ විගණකවරයන්, අතිරේක විගණනවලට, විගණන වාර්තාවලට අදාළ ඇතැම් විධිවිධාන සංශෝධනය කිරීම සහ බලපත්‍රලාභී වාණිජ බැංකු සම්බන්ධයෙන් පවත්වන ලද අතිරේක විගණනවල පිරිවැය මහ බැංකුව වෙනුවට එම බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් ගෙවන ලෙස එම බැංකු වෙත නියම කිරීම වේ.

***23 වන වගන්තිය:*** මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 41 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක පාලිත සමාගම්වලට සීමා කිරීමෙන් තොරව තනි සහ ඒකාබද්ධ පදනමක් මත එම බලපත්‍රලාභී වාණිජ බැංකුව පරීක්ෂා කර බැලීමට සලස්වනු ලැබීම සඳහා මහ බැංකුව වෙත හැකියාව ලබා දීම වේ.

***24 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 42 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ එම වගන්තියේ (5) වන සහ (6) වන උපවගන්ති යටතේ යම් තැනැත්තකුගේ පත් කිරීම, තෝරා පත් කිරීම හෝ නාමයෝජනා කිරීම අනුමත කරනු ලැබ නොමැති නම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින්, එම තැනැත්තා එම බලපත්‍රලාභී වාණිජ බැංකුවේ අධ්‍යක්ෂවරයකු වශයෙන් පත් කර නොගැනීම, තෝරා පත් කර නොගැනීම හෝ නාමයෝජනා නොකිරීම සඳහා විධිවිධාන සැලැස්වීම සහ බලපත්‍රලාභී වාණිජ බැංකුවක අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම් පුළුල් කිරීම වේ.

***25 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 44අ වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ ප්‍රධාන ප්‍රඥප්තියේ 42(2) වන වගන්තියේ දක්වා ඇති නිර්ණායකවලට අනුකූලව මහ බැංකුව විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි බලපත්‍රලාභී වාණිජ බැංකුවක ප්‍රධාන විධායක නිලධරයා සහ විධායක කර්තව්‍ය ඉටු කරනු ලබන නිලධරයන් යන තනතුර සඳහා එම ප්‍රධාන වාධායක නිලධරයා සහ විධායක කර්තව්‍ය ඉටු කරනු ලබන නිලධරයන් නිසි සහ සුදුසු තැනැත්තන් විය යුතු බවට නියම කිරීම වේ.

***26 වන වගන්තිය:*** මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 44ආ වන සහ 44ඇ වන අලුත් වගන්ති ඇතුළත් කරනු ලබන අතර එම නව වගන්තිවල නීතියේ බලපෑම වනුයේ බලපත්‍රලාභී වාණිජ බැංකුවක හෝ වෙනත් යම් මූල්‍ය ආයතනයක අධ්‍යක්ෂවරයකු, ප්‍රධාන විධායක නිලධරයා හෝ විධායක කර්තව්‍ය ඉටු කරනු ලබන නිලධරයකු වශයෙන් පත් කිරීම, තෝරා පත් කිරීම හෝ නාමයෝජනා කිරීමට තැනැත්තකු නිසි සහ සුදුසු තැනැත්තකු වීම සඳහා නුසුදුස්සකු බවට පත් කරනු ලැබිය හැකි පරිදි යම් තැනැත්තකු එම ධුරයේ සේවය කළ කාලය තුළ දී වංචාව, රැවටීම, වංක ක්‍රියාවක් හෝ වෙනත් සමාන අපරාධ ක්‍රියාවක් හෝ වෙනත් නුසුදුසු පැවැත්මකින් සංයුක්තවන ක්‍රියාවක් සිදු කර ඇති හෝ සිදු කිරීමට සම්බන්ධ වී ඇති අවස්ථාවක දී, එම තැනැත්තා තවදුරටත් එම බලපත්‍රලාභී වාණිජ බැංකුවේ හෝ මූල්‍ය ආයතනයේ එකී ධුරය දරනු නොලැබුවේ වුව ද, එම තැනැත්තාට කරුණු කියා පෑමට අවස්ථාවක් ලබා දීමට යටත්ව, එවැනි තැනැත්තකු නිසි සහ සුදුසු තැනැත්තකු නොවන බවට විධිවිධාන සැලැස්වීම පිණිස වේ. තව ද, එසේ මේ වගන්තිය යටතේ නිසි සහ සුදුසු නොවන බවට නිශ්චය කළ තැනැත්කු මහ බැංකුව විසින් නියාමනය කරනු ලබන සහ අධීක්ෂණය කරනු ලබන බලපත්‍රලාභී වාණිජ බැංකුවක හෝ වෙනත් යම් මුදල් ආයතනයක අධ්‍යක්ෂවරයකු, ප්‍රධාන විධායක නිලධරයා හෝ විධායක කර්තව්‍ය ඉටු කරනු ලබන නිලධරයකු වශයෙන් පත් කිරීම, තෝරා පත් කිරීම හෝ නාමයෝජනා කිරීම සඳහා යෝග්‍ය නොවිය යුතු බවට විධිවිධාන සැලැස්වීම වේ. යම් ගැටුම් සහගත තත්ත්වයක් ඇති වන අවස්ථාවක දී තත්කාලයෙහි බලපවත්නා වෙනත් යම් ලිඛිත නීතියක් අභිබවමින් VI වන කොටසේ විධිවිධාන බලපැවැත්විය යුතු බවට ද තවදුරටත් විධිවිධාන සැලැස්වීම වේ.

***27 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ එම වගන්තිය යටතේ බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත විධාන නිකුත් කිරීමේ දී එම බැංකුවල වත්කම් ප්‍රමාණය, පරිමාණය, විවිධත්වය සහ මෙහෙයුම්වල සංකීර්ණ බව සැලකිල්ලට ගන්නා ලෙස මහ බැංකුව වෙත නියම කිරීම සහ බලපත්‍රලාභී

වාණිජ බැංකුවක් විසින් ප්‍රදානය කරනු ලැබිය හැකි විශාල ගනුදෙනු නිරාවරණය කිරීම පිළිබඳ සීමාව පුළුල් කිරීම, පාලන සම්බන්ධතාවක් සහ ආර්ථික අන්තර් රැඳියාව ඇතුළත් කිරීම සහ එම වගන්තියේ (ඇ) වන ඡේදයේ සඳහන් නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීම සඳහා එකී බැංකු වෙත අවුරුදු තුනක අන්තර් කාලසීමාවක් හෝ මහ බැංකුව විසින් නිශ්චය කරනු ලැබිය යුතු වෙනත් යම් කාලසීමාවක් ප්‍රදානය කිරීම වේ.

***28 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 47(1) වන වගන්තිය ඉවත් කරනු ලබන අතර සංශෝධිත පරිදි එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ බලපත්‍රලාභී වාණිජ බැංකුවල මෙරට බැංකු ව්‍යාපාර සඳහා පමණක් එම වගන්තිය අදාළ වීම සීමා කිරීම සහ එම වගන්තියේ (4) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති සීමාවන් ඉක්මවමින් යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් ප්‍රදානය කරනු ලබන යම් අනුග්‍රහ මුදලක් අඩු කරන ලෙස එම බැංකුවක් වෙත නියම කිරීම වේ.

***29 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ VIIඅ වන කොටස ඉවත් කරනු ලබන අතර නීතියේ බලපෑම වනුයේ බලපත්‍රලාභී වාණිජ බැංකුවක බැංකු ව්‍යාපාර කටයුතු පැවරීමට අදාළ විධිවිධාන 2023 අංක 17 දරන බැංකු (විශේෂ විධිවිධාන) පනතෙහි අන්තර්ගතව ඇති බැවින් එම පනතේ විධිවිධානවල අදාළත්වය සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම වේ.

***30 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 50 වන වගන්තිය ඉවත් කරනු ලබන අතර සංශෝධිත පරිදි එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ ඈවරකරුවකු පත් කිරීමට අදාළ විධිවිධාන 2023 අංක 17 දරන බැංකු (විශේෂ විධිවිධාන) පනත මගින් විධිවිධාන සලස්වා ඇති බැවින් ඈවරකරු පත් කිරීමට අදාළ විධිවිධාන ඉවත් කිරීම වේ.

***31 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 55 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීමට යටත් බලපත්‍රලාභී වාණිජ බැංකුවක ආරක්ෂිත තැන්පතු පෙට්ටියේ පවත්වාගෙන යනු ලබන හිමිකම් නොපාන ලද මුදල් සහ භාණ්ඩ මහ බැංකුවේ යම් විශේෂිත ගිණුමක් වෙත මාරු කිරීම සඳහා හෝ තත්කාර්ය සඳහා සාදනු ලබන මාර්ගෝපදේශ යටතේ මහ බැංකුව විසින් විධාන කරනු ලබන පරිදි බැහැර කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වේ.

***32 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 56 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ ස්වේච්ඡාවෙන් ඈවර කිරීමට යටත් බලපත්‍රලාභී වාණිජ බැංකුවක බලපත්‍රය අවලංගු කිරීමට අදාළව අනුගමනය කිරීමට නියමිත කාර්යපටිපාටිය සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

***33 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 57 වන වගන්තියේ සිට 69 වන වගන්තිය දක්වා වූ වගන්ති ඉවත් කරනු ලබන අතර සංශෝධිත පරිදි එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ බලපත්‍රලාභී වාණිජ බැංකු අනිවාර්යයෙන් ගණන් බේරා වසා දැමීමට අදාළ විධිවිධාන සම්බන්ධයෙන් 2023 අංක 17 දරන බැංකු (විශේෂ විධිවිධාන) පනතේ විධිවිධාන ඇතුළත් කර ඇති බැවින් එම පනතේ විධිවිධානවල අදාළත්වය සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම පිණිස වේ.

***34 සහ 35 වන වගන්ති:*** මෙම වගන්ති මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 70 වන සහ 72 වන වගන්ති සංශෝධනය කරනු ලබන අතර එය 33 වන වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 63 සහ 68 වන වගන්ති සඳහා කරන ලද සංශෝධනවලට ආනුෂංගික වේ.

***36 වන වගන්තිය:*** මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 76ඈ වන වගන්තිය ඉවත් කරනු ලබන අතර එය 17 වන වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ IV වන කොටසට කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

***37 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 76උ වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ බලපත්‍රලාභී විශේෂිත බැංකු විසින් පවත්වාගෙන යාමට නියමිත අවම ස්කන්ධ ප්‍රාග්ධන අවශ්‍යතාවය සම්බන්ධයෙන් අමාත්‍යවරයාගේ එකඟත්වය ලබා ගැනීමේ නියමය ඉවත් කිරීම වේ.

*38 වන වගන්තිය:* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 76ඌ වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා ද ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තියේ අදාළත්වය සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම වේ.

*39 වන වගන්තිය:* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 76එ වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ එම වගන්තිය යටතේ බලපත්‍රලාභී විශේෂිත බැංකුවලට විධාන නිකුත් කිරීමේ දී එම බැංකුවල වත්කම්වල ප්‍රමාණය, පරිමාණය, විවිධත්වය සහ මෙහෙයුම්වල සංකීර්ණ බව සලකා බැලීම සඳහා මහ බැංකුව සතු හැකියාව පුළුල් කිරීම වේ.

*40 වන වගන්තිය:* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 76ඔ වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා ද ප්‍රධාන ප්‍රඥප්තියේ 47 වන, 48අ වන, 49 වන සහ 49අ වන වගන්තිවල අදාළත්වය ඇතුළත් කිරීම වේ.

*41 වන වගන්තිය:* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 76ක වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ බලපත්‍රලාභී විශේෂිත බැංකුවල අනිවාර්ය ඈවර කිරීම පිළිබඳව විධිවිධාන 2023 අංක 17 දරන බැංකු (විශේෂ විධිවිධාන) පනතේ ඇතුළත් කර ඇති බැවින් එම විධිවිධානවල අදාළත්වය සම්බන්ධයෙන් විධිවිධාන සැලසීම වේ.

*42 වන වගන්තිය:* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 79 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර එය 17 වන වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ IV වන කොටසට කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

*43 වන වගන්තිය:* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 79ආ වන අලුත් වගන්තියක් ඇතුළත් කරනු ලබන අතර එම නව වගන්තියේ නීතියේ බලපෑම වනුයේ ප්‍රධාන ප්‍රඥප්තියේ ඇතැම් විධිවිධාන උල්ලංඝනය කිරීම් සඳහා පරිපාලනමය දඩ පැනවීම සඳහා මහ බැංකුවට හැකියාව ලබා දීම සහ තැනැත්තකු විසින් කරන ලද උල්ලංඝනය කිරීමේ ප්‍රමාණය අනුව ඔහු වෙත පරිපාලනමය දඩ පැනවීම සඳහා වන කාර්යපටිපාටිය සහ දඩ මුදල නිශ්චය කිරීමට මහ බැංකුවට හැකියාව ලබා දීම වේ.

*44 වන වගන්තිය:* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 83අ වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා ද (99 වන අධිකාරය වූ) බඩු උකස් ගන්නන්ගේ ආඥාපනතේ විධිවිධාන අදාළ නොවන බව පුළුල් කිරීම වේ.

*45 වන වගන්තිය:* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට 83ඈ වන සහ 83ඉ වන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර එම නව වගන්තිවල නීතියේ බලපෑම වනුයේ -

(අ) මහ බැංකුවේ බලතල, කාර්ය සහ කර්තව්‍යවලින් යමක්, මහ බැංකුව විසින්, මහ බැංකුවේ නිශ්චිත තනතුරු දරන්නා වූ යම් නිලධරයන් වෙත හෝ එම නිලධරයන්ගෙන් සැදුම්ලත් යම් කමිටුවක් වෙත පැවරීම පිණිස ද; සහ

(ආ) මහ බැංකුවේ බලතල, කාර්ය සහ කාර්තව්‍ය ඉටු කිරීම සඳහා මහ බැංකුව විසින් අවශ්‍ය යයි සලකනු ලැබිය හැකි යම් තොරතුරක් සැපයීම සඳහා මහ බැංකුව විසින් යම් තැනැත්තකුට දැන්වීම පිණිස ද,

විධිවිධාන සැලැස්වීම වේ.

*46 වන වගන්තිය:* මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 86 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ විගණකාධිපතිවරයා, අර්ථලාභී හිමිකරුවා, ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කරන ලද බලපත්‍රලාභී වාණිජ බැංකුවක ශාඛාවක අධ්‍යක්ෂ මණ්ඩලය, පාලන සම්බන්ධතාව, බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා, ආර්ථික අන්තර් රැඳියාව, විගණනය

භාර හවුල්කරුවා, ගනුදෙනු නිරාවරණය, ජාත්‍යන්තර ප්‍රමිති, අමාත්‍යවරයා, මූල්‍ය නොවන පාලිත සමාගම, අක්වෙරළ බැංකු ව්‍යාපාර, භෞතිකව පැවතීම, කොටස්හිමියා, ෂෙල් බැංකුව සහ නීති විරෝධී ක්‍රියාකාරකම් යන යෙදුම්වල අර්ථ නිරූපණ ඇතුළත් කිරීම වේ.

***47 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ II වන උපලේඛනය සංශෝධනය කරනු ලබන අතර නීතියේ බලපෑම වනුයේ බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා අවසර දිය හැකි කටයුත්තක් ලෙස අක්වෙරළ බැංකු ව්‍යාපාර සිදු කිරීම ඇතුළත් කිරීම වේ.

***48 වන වගන්තිය:*** මේ වගන්තිය මගින්, ප්‍රධාන ප්‍රඥප්තියේ 76ක වන වගන්තිය යටතේ මුදල් මණ්ඩලය විසින් සකස් කරන ලද යෝජනා ක්‍රමයේ නියම හා කොන්දේසිවලට අනුකූලව, එම වගන්තියේ (3ඇ) වන උපවගන්තියේ සඳහන් ගෙවීම් පැහැරහරින ලද බැංකුවේ තැන්පත්කරුවන්ගේ සහ ණයහිමියන්ගේ වගකීම් සම්පූර්ණයෙන් ගෙවා නිරාකරණය කරනු ලබන තෙක් එම යෝජනා ක්‍රම අඛණ්ඩව බලාත්මක විය යුතු බව ග්‍රහණය කර ගැනීම සඳහා ප්‍රධාන ප්‍රඥප්තියට ශේෂ විධිවිධානයක් හඳුන්වා දෙනු ලැබේ.

එල්.ඩී.-ඕ. 42/2023

## 1988 අංක 30 දරන බැංකු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

*ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය*

**1.** (1) මේ පනත 2024 අංක      දරන බැංකු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

(2) මේ පනතේ විධිවිධාන, (මේ පනතේ "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි යම් දිනයක සිට ක්‍රියාත්මක වන්නේ ය.

*1988 අංක 30 දරන පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම*

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1988 අංක 30 දරන බැංකු පනතේ 2 වන වගන්තිය, එහි (6) වන උපවගන්තියේ "ඊට මහ බැංකුව හෝ මේ පනතේ I වන උපලේඛනයේ නිශ්චයකොට දැක්වෙන බැංකු හැර," යන වචන සහ ඉලක්කම් වෙනුවට "ඊට මහ බැංකුව, ෂෙල් බැංකුවක් හෝ මේ පනතේ I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති බැංකු හැර" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

*ප්‍රධාන ප්‍රඥප්තියට 2අ වන වගන්තිය ඇතුළත් කිරීම*

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එම ප්‍රඥප්තියේ 2අ වන වගන්තිය ලෙස බලාත්මක විය යුතු යː-

"*බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කිරීම පිණිස සුදුසුකම් ලැබීමේ නිර්ණායක*

2අ. මේ පනත යටතේ බලපත්‍රයක් ලබා ගැනීමට ඉල්ලුම් කිරීම සඳහා යම් සමාගමක් සුදුසුකම් ලබන්නේ ද යන වග නිශ්චය කිරීමේ දී මහ බැංකුව විසින් පහත දැක්වෙන කාරණා සැලකිල්ලට ගනු ලැබිය යුතු යː-

(අ) මහ බැංකුව විසින්, කලින් කල, නිශ්චය කරනු ලැබිය හැකි පරිදි මූලික ප්‍රාග්ධන නියමයන් සම්බන්ධයෙන් වන අනුකූලතාව;

(ආ) ශ්‍රී ලංකාවේ පිහිටුවීමට නියමිත බලපත්‍රලාභී වාණිජ බැංකුව සඳහා අඛණ්ඩ මූල්‍ය සහාය ලබා දෙන ක්‍රමයක් වශයෙන් මූල්‍ය සම්පත්වල ස්වභාවය සහ ප්‍රමාණවත් බව;

(ඇ) ප්‍රාග්ධනය සහ වෙනත් අරමුදල් මූලාශ්‍ර නීති විරෝධී ක්‍රියාකාරකම්වලින් ව්‍යුත්පන්න නොවන බව;

(ඈ) 12 වන වගන්තියේ (1ආ) වන උපවගන්තිය ප්‍රකාර වැදගත් කොටස් හිමියන්ගේ යෝග්‍යතාව;

(ඉ) 42 වන වගන්තියේ (2) වන උපවගන්තියේ දක්වා ඇති නිර්ණායක ප්‍රකාර, අවස්ථාවෝචිත පරිදි, අධ්‍යක්ෂවරයන්ගේ, ප්‍රධාන විධායක නිලධරයාගේ සහ විධායක කර්තව්‍ය ඉටු කරන්නා වූ නිලධරයන්ගේ හෝ ඉහත කුමන හෝ තනතුරකට පත් කරනු ලැබීමට යෝජිත වෙනත් යම් තැනැත්තකුගේ නිසි හා සුදුසු බව;

(ඊ) යහපාලනය සහ අවංකබව පිළිබඳ ප්‍රමිතීන්ට අනුකූල වන ආකාරයට ක්‍රියාත්මක වන බවට වන අතීත වාර්තා;

(උ) හිමිකාරිත්ව ව්‍යුහයේ සහ ප්‍රතිලාභී හිමිකාරිත්වයේ විනිවිදභාවය;

(ඌ) බලපත්‍රලාභී වාණිජ බැංකුවක් ශ්‍රී ලංකාව තුළ පිහිටුවීම, බැංකු පද්ධතියේ ජීවගුණය සහ ස්ථායීභාවයේ යහපත සහ ජාතික ආර්ථිකයේ යහපත පිණිස වන බව; සහ

(එ) මේ පනත යටතේ හෝ ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ වන වෙනත් යම් නියම සමඟ ඇති අනුකූලතාව.”.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය සංශෝධන කිරීම

(1) එහි (1) වන උපවගන්තියේ "නියම කරනු ලබන ආකාරයට ලියවිල්ලකින්" යන වචන වෙනුවට "නියම කරනු ලබන ආකාරයට ලියවිල්ලකින් සහ ඉල්ලුම් පත්‍ර ගාස්තුව සමඟ" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) එහි (2) වන උපවගන්තියේ (ආ) වන ඡේදයේ (iii) වන අනුඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"(iii) පෙරාතුව ම වූ අවුරුදු තුන සඳහා සමාගමේ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශවල පිටපතක්;".

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) එහි (1) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"(1) සිය ශාඛාවක් මගින් බැංකු ව්‍යාපාර කරගෙන යාම සඳහා 3 වන වගන්තිය යටතේ බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කර ඇති ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කරන ලද යම් සමාගමක් හෝ සංස්ථාපිත මණ්ඩලයක් විසින් ස්වකීය ව්‍යාපාර කටයුතු ශ්‍රී ලංකාව තුළ ආරම්භ කිරීමට පෙරාතුව, එම සමාගම හෝ සංස්ථාපිත මණ්ඩලය විසින් එක්සත් ජනපද ඩොලර්වලින් නිශ්චය කරනු ලබන යම් මුදල් ප්‍රමාණයක් හෝ යම් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලින් එයට සමාන මුදල් ප්‍රමාණයක් ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කිරීමට භාරගන්නා ලෙස මහ බැංකුව විසින් එකී සමාගමට හෝ සංස්ථාපිත මණ්ඩලයට නියම කරනු ලැබිය හැකි ය. එසේ ප්‍රේෂණය කරනු ලබන මුදල් ප්‍රමාණය, ඒ සමාගමේ හෝ සංස්ථාපිත මණ්ඩලයේ

පැවරූ ප්‍රාග්ධනයෙහි කොටසක් විය හැකි අතර, තැන්පතුවක් ලෙස මහ බැංකුවෙහි හෝ මහ බැංකුව විසින්, කලින් කල, නිශ්චය කරනු ලැබිය හැකි පරිදි වෙනත් ආකාරයකින් තබාගනු ලැබිය යුතු ය.";

(2) එහි (3) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන්:-

"(4) (1) වන උපවගන්තියේ විධිවිධානවලට අගතියක් නොමැතිව, මූල්‍ය තත්වයේ ශක්තිමත්භාවය, අවදානම් කළමනාකරණය, පාලන ව්‍යුහය, ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවය සහ ද්‍රවශීලතාව පැවතීම සැලකිල්ලට ගෙන, මහ බැංකුව විසින්, (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති සමාගමට හෝ සංස්ථාපිත මණ්ඩලයට ශ්‍රී ලංකාව තුළ බැංකු ව්‍යාපාර කරගෙන යාම පිණිස බලපත්‍රයක් නිකුත් කරනු ලැබීම සඳහා එකී සමාගම හෝ සංස්ථාපිත මණ්ඩලය එහි මව් සමාගමේ හෝ ප්‍රධාන සංස්ථාපිත මණ්ඩලයේ පාලිත සමාගමක් ලෙස ශ්‍රී ලංකාව තුළ පිහිටුවන ලෙස නියම කරනු ලැබිය හැකි ය.

(5) ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කරන ලද වාණිජ බැංකුවක් නියමිත දිනට පෙරාතුව ම ශ්‍රී ලංකාව තුළ ශාඛාවක් ලෙස ක්‍රියාත්මක වන අවස්ථාවක, මහ බැංකුව විසින් කරනු ලබන යම් විධානයක නිශ්චිතව දක්වනු ලැබිය හැකි පරිදි වූ නියම හා කොන්දේසිවලට යටත්ව, මහ බැංකුව විසින් මූල්‍ය තත්ත්වයේ ශක්තිමත්භාවය, අවදානම් කළමනාකරණය, පාලන ව්‍යුහය, ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවය සහ ද්‍රවශීලතාව පැවතීම සැලකිල්ලට ගෙන, ශ්‍රී ලංකාව තුළ බැංකු ව්‍යාපාර කරගෙන යාම සඳහා එම බැංකුවේ මව් සමාගමේ හෝ ප්‍රධාන සංස්ථාපිත මණ්ඩලයේ පාලිත සමාගමක් ලෙස පිහිටුවීමට එකී බැංකුවට විධාන කරනු ලැබිය හැකි ය.".

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය, එහි (2) වන උපවගන්තියේ (අ) වන ඡේදය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම

"(අ) බැංකු ව්‍යාපාර කරගෙන යාම සඳහා එම සමාගමට අවසර ලබා දී ඇද්ද යන වග;".

ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය, එහි (2) වන උපවගන්තියේ "මුදල් මණ්ඩලය" යන වචන වෙනුවට "බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ (ඇ) වන ඡේදය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(ඇ) එම බලපත්‍රලාභී වාණිජ බැංකුව බුන්වත්භාවයට පත්ව ඇති බව සහ ගණන් බේරා වසා දැමීම සඳහා ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත, තත්කාලයේ බලපවත්නා වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ නඩු කටයුතු ආරම්භ කොට ඇති බව සහ එම බැංකුවේ තැන්පත්කරුවන්ගේ සහ ණයහිමියන්ගේ යහපත උදෙසා එම බැංකුව සඳහා ඈවරකරුවකු හෝ ලැබුම්කරුවකු පත් කර ඇති බව; හෝ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය සංශෝධනය කිරීම

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (2) වන උපවගන්තියේ, "මේ පනතේ VIII වන කොටසේ විධිවිධානවලට අනුකූලව ආරම්භ කරනු ලැබිය යුතු ය." යන වචන වෙනුවට "ශ්‍රී ලංකාව තුළ යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් ගණන් බේරා වසා දැමීම සඳහා විශේෂයෙන් විධිවිධාන සලසනු ලබන තත්කාලයේ බලපවත්නා වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනුකූලව ආරම්භ කරනු ලැබිය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන්;

(2) එහි (3) වන උපවගන්තියේ "ශ්‍රී ලංකාව තුළ සහ ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් කරගෙන යන කටයුතු මේ පනතේ VIII වන කොටසේ විධිවිධානවලට අනුකූලව වසා දමන ලෙසත්" යන වචන වෙනුවට "ශ්‍රී ලංකාව තුළ යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් ගණන් බේරා වසා දැමීම

සඳහා විශේෂයෙන් විධිවිධාන සලසනු ලබන තත්කාලයේ බලපවත්නා වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනුකූලව එම බැංකුවේ ව්‍යාපාර කටයුතු වසා දමන ලෙසත්" යන වචන ආදේශ කිරීමෙන්;

(3) එහි (4) වන උපවගන්තියේ,-

(අ) (උ) වන ඡේදයේ "නියම කළ හැකි ය;" යන වචන වෙනුවට "නියම කළ හැකි ය; සහ" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) (ඌ) ඡේදයේ "නියම කළ හැකි ය; සහ" යන වචන වෙනුවට "නියම කළ හැකි යඃ" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ඇ) "(එ) බලපත්‍රලාභී වාණිජ බැංකුවේ" යන වචනවලින් ආරම්භ වී "අදාළ විය යුතු යඃ" යන වචනවලින් අවසන් වන සියලු වචන ඉවත් කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය සංශෝධනය කිරීම

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (1) වන උපවගන්තියේ, -

(අ) "අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, මුදල් මණ්ඩලය විසින් දෙන ලද ලිඛිත අනුමතිය අවශ්‍ය වන්නේ ය." යන වචන වෙනුවට "මහ බැංකුවේ ලිඛිත අනුමතය අවශ්‍ය වන්නේ ය." යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) එහි (ආ) වන ඡේදයේ, "හෝ කාර්යාලයක්" යන වචන වෙනුවට "හෝ කාර්යාලයක්, අමාත්‍යවරයා විමසා" යන වචන ආදේශ කිරීමෙන්;

(ඇ) එහි (ඇ) වන ඡේදය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"(ඇ) බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින්, අවස්ථාවෝචිත පරිදි, වෙනත් බලපත්‍රලාභී වාණිජ බැංකුවක, බලපත්‍රලාභී විශේෂිත

බැංකුවක හෝ බලපත්‍රලාභී මුදල් සමාගමක ව්‍යාපාර හෝ ව්‍යාපාරවලින් කොටසක් හෝ එකී බලපත්‍රලාභී වාණිජ බැංකුවේ, බලපත්‍රලාභී විශේෂිත බැංකුවේ හෝ බලපත්‍රලාභී මුදල් සමාගමේ ශාඛාවක් අත්පත් කර ගැනීම සඳහා ද, ස්වකීය ව්‍යාපාර සියල්ලම හෝ ඉන් කොටසක් විකිණීම සඳහා ද;";

(ඈ) එහි (ඈ) වන ඡේදයේ, "ශ්‍රී ලංකාවෙන් බැහැර සංස්ථාගත කරන ලද" යන වචන වෙනුවට "මහ බැංකුව විසින්, කලින් කල, නිශ්චය කරනු ලැබිය හැකි පරිදි ඉල්ලුම්පත්‍ර ගාස්තුවට යටත්ව, ශ්‍රී ලංකාවෙන් බැහැරව සංස්ථාගත කරන ලද" යන වචන ආදේශ කිරීමෙන්;

(ඉ) එහි (ඉ) වන ඡේදයේ, "යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් හෝ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක්" යන වචන වෙනුවට "යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක්, බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් හෝ බලපත්‍රලාභී මුදල් සමාගමක්" යන වචන ආදේශ කිරීමෙන්;

(ඊ) එහි (ඉ) වන ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස එකතු කිරීමෙන්:-

"(ඊ) මහ බැංකුවේ නියාමනයට හෝ අධීක්ෂණයට යටත් වෙනත් මූල්‍ය ආයතනයක ව්‍යාපාර හෝ ව්‍යාපාරවලින් කොටසක් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් හෝ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් විසින් අත්පත් කර ගැනීම සඳහා ද.";

(2) එහි (1ආ) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"(1ආ) එවැනි අත්පත් කර ගැනීමක් හෝ එක් කිරීමක් හෝ ඒකාබද්ධ කිරීමක් සුරක්ෂිත, ශක්තිමත් සහ ස්ථාවර බැංකු පද්ධතියක් සහ බැංකු කර්මාන්තයෙහි පවත්නා සාධාරණ වෙළඳපොළ තරගය වැඩිදියුණු කිරීමෙහිලා ඉවහල් වන බවට මහ බැංකුව සෑහීමට

පත්වන්නේ නම් මිස, (1) වන උපවගන්තියේ (ඇ), (ඉ) හෝ (ඊ) වන ඡේදය යටතේ හෝ (1ඇ) වන උපවගන්තිය යටතේ අනුමතයක් ප්‍රදානය නොකළ යුතු ය. (1ඇ) වන උපවගන්තිය යටතේ කරනු ලබන අත්පත් කර ගැනීමක් සඳහා පුද්ගලයකුට හෝ සංස්ථාපිත මණ්ඩලයකට අනුමතය ප්‍රදානය කිරීමේ දී, මහ බැංකුව විසින්, අවස්ථාවෝචිත පරිදි, ඒ පුද්ගලයා හෝ ඒ සංස්ථාපිත මණ්ඩලයේ අධ්‍යක්ෂවරයන් නිසි සහ සුදුසු තැනැත්තන් ද යන්න නිශ්චය කිරීමේ දී පහත දැක්වෙන කාරණාවලට අමතරව 42 වන වගන්තියේ (2) වන උපවගන්තියේ දක්වා ඇති නිර්ණායක සැලකිල්ලට ගත යුතු ය:-

(අ) පුද්ගලයාගේ හෝ සංස්ථාපිත මණ්ඩලයේ අධ්‍යක්ෂවරුන්ගේ අතීත වාර්තා;

(ආ) පුද්ගලයාගේ හෝ සංස්ථාපිත මණ්ඩලයේ ව්‍යාපාර සැලසුම්වල ශක්තිමත්භාවය සහ ශක්‍යතාව;

(ඇ) බලපත්‍රලාභී වාණිජ බැංකුව වෙත අඛණ්ඩ මූල්‍ය සහාය ලබා දීමේ මූලාශ්‍රයක් ලෙස පුද්ගලයාගේ හෝ සංස්ථාපිත මණ්ඩලයේ මූල්‍ය සම්පත්වල ස්වභාවය සහ ප්‍රමාණවත් බව සහ එකී අරමුදල් සැපයීමේ මූලාශ්‍රවල නීත්‍යනුකූලභාවය;

(ඈ) පෙරාතුව ම වූ අවුරුදු තුන සඳහා සංස්ථාපිත මණ්ඩලයේ ව්‍යාපාර පිළිබඳ වාර්තා සහ පළපුරුද්ද; සහ

(ඉ) හිමිකාරිත්ව ව්‍යුහයේ සහ අර්ථලාභී හිමිකාරිත්වයේ විනිවිදභාවය.";

(3) එහි (1ඇ) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"(1ඇ) (අ) පුද්ගලයකු, හවුල් ව්‍යාපාරයක් හෝ සංස්ථාපිත මණ්ඩලයක් විසින්, ඍජුව හෝ

වක්‍රාකාරයෙන් හෝ නාමිකයකු මගින් හෝ වෙනත් යම් පුද්ගලයකු, හවුල් ව්‍යාපාරයක් හෝ සංස්ථාපිත මණ්ඩලයක් සමඟ සහචින්තනයෙන් ක්‍රියා කරමින් යම් ලිඛිත නීතියක් මගින් හෝ ඒ යටතේ ශ්‍රී ලංකාව තුළ සංස්ථාගත කරන ලද හෝ පිහිටුවන ලද බලපත්‍රලාභී වාණිජ බැංකුවක වැදගත් අයිතිවාසිකමක් මහ බැංකුවේ පූර්ව ලිඛිත අනුමතය නොමැතිව අත්පත් කර නොගත යුතු ය.

(ආ) (2) වන උපවගන්තියේ ව්‍යාප්තියට අගතියක් නොමැතිව, මේ උපවගන්තියේ (අ) වන ඡේදය යටතේ වන අනුමතය මහ බැංකුව විසින් උචිත යයි සලකනු ලැබිය හැකි නියම සහ කොන්දේසිවලට යටත්ව ප්‍රදානය කරනු ලැබිය හැකි ය.

(ඇ) (3) වන උපවගන්තියේ විධිවිධානවලට අගතියක් නොමැතිව, බලපත්‍රලාභී වාණිජ බැංකුවක ලේකම්වරයා විසින්, (අ) වන ඡේදය උල්ලංඝනය කරමින් වැදගත් අයිතිවාසිකම අත්පත් කරගෙන ඇත්තේ යම් පුද්ගලයකු විසින් ද, ආස්ථිත්‍යයක් විසින් ද (සංස්ථාගත කළ හෝ සංස්ථාගත නොකළ) හෝ එම පුද්ගලයාගේ හෝ ආස්ථිත්‍යයේ නාමිකයකු විසින් ද එම පුද්ගලයාගේ නම, ආස්ථිත්‍යයේ නම හෝ එකී පුද්ගලයාගේ හෝ ආස්ථිත්‍යයේ නාමිකයකුගේ නම කොටස් නාමලේඛනයේ, කොටස් හිමියන්ගේ සුචියෙහි හෝ එම බලපත්‍රලාභී වාණිජ බැංකුවේ කොටස් හිමියන් පිළිබඳ වාර්තා තබා ගැනීමට පවත්වාගෙන යනු ලබන වෙනත් යම් නාමලේඛනයක ඇතුළත් කරනු නොලැබිය යුතු අතර, එම තැනැත්තා එම බලපත්‍රලාභී වාණිජ බැංකුවේ කොටස් හිමියකු ලෙස හඳුනා ගැනීම හෝ එම බලපත්‍රලාභී වාණිජ බැංකුවේ කොටස් හිමියකු ලෙස සලකනු ලැබිය යුතු තැනැත්තකු වශයෙන් හඳුනා ගැනීම නොකළ යුතු ය.

(ඈ) (3) වන උපවගන්තියේ විධිවිධානවලට අගතියක් නොමැතිව, බලපත්‍රලාභී වාණිජ බැංකුවක දැනට සිටින කොටස් හිමියකු විසින් (1ඇ) වන උපවගන්තිය උල්ලංඝනය කරනු ලැබ ඇති අවස්ථාවක, මහ බැංකුව විසින්, ඒ බලපත්‍රලාභී වාණිජ බැංකුවට කරන

විධානයක දී, එම කොටස් හිමියාගේ නම, අවස්ථාවෝචිත පරිදි, කොටස් නාමලේඛනයෙන්, කොටස් හිමියන්ගේ සුචියෙන් හෝ එම බලපත්‍රලාභී වාණිජ බැංකුව විසින් කොටස් හිමියන් පිළිබඳ වාර්තා තබා ගැනීම සඳහා පවත්වාගෙන යනු ලබන වෙනත් යම් නාමලේඛනයකින් ඒ විධානයේ නිශ්චිතව දක්වනු ලැබිය හැකි කාලසීමාවක් ඇතුළත දී ඉවත් කරන ලෙසට ඒ බලපත්‍රලාභී වාණිජ බැංකුව වෙත විධාන කිරීම නීත්‍යනුකූල වන්නේ ය. ඒ ඉවත් කිරීම සඳහා වන විධානයේ දින සිට බලපැවැත්වෙන පරිදි ඒ විධානයට අනුකූල වීම ඒ බලපත්‍රලාභී වාණිජ බැංකුවේ කාර්යය විය යුතු අතර, එකී කොටස් හිමියා (1ඇ) වන උපවගන්තියේ විධිවිධාන සමඟ අනුකූල වන තෙක් එම කොටස් හිමියා ඒ බලපත්‍රලාභී වාණිජ බැංකුවේ කොටස් හිමියකු ලෙස සැලකීම හෝ සලකනු ලැබීම නොකළ යුතු ය.

(ඉ) මේ උපවගන්තියේ කාර්ය සඳහා -

"සහචින්තනයෙන් ක්‍රියාකිරීම" යන්නෙන් බලපත්‍රලාභී වාණිජ බැංකුවක පාලනය ලබා ගැනීම හෝ ඒකාබද්ධ කිරීම පිණිස එම බලපත්‍රලාභී වාණිජ බැංකුවේ වැදගත් අයිතිවාසිකමක් අත්පත් කර ගැනීමේ දී ක්‍රියාකාරී ලෙස සහයෝගය දැක්වීම පිණිස එකඟත්වයකට (විධිමත් හෝ අවිධිමත්) අනුකූලව කටයුතු කිරීම අදහස් වේ;

"වැදගත් අයිතිවාසිකම" යන්නෙන්, යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක ඡන්දය ප්‍රකාශ කිරීම් අයිතිය ලබා දෙන එහි නිකුත් කළ ප්‍රාග්ධනයෙන් සියයට දහයකට වැඩි ප්‍රමාණයක් දැරීම හෝ බලපත්‍රලාභී වාණිජ බැංකුවක

අධ්‍යක්ෂවරයකු, ප්‍රධාන විධායක නිලධරයා හෝ විධායක කර්තව්‍ය ඉටු කරනු ලබන නිලධරයකු නම් කිරීම, පත් කිරීම හෝ ඉවත් කිරීමට හෝ ගිවිසුමකට හෝ අන්‍යාකාරයකට අනුව එකී බැංකුවේ ප්‍රතිපත්ති මත පාලනයක් ක්‍රියාත්මක කිරීමට බලපත්‍රලාභී වාණිජ බැංකුවට සැලකිය යුතු බලපෑමක් පවතින බව මහ බැංකුව විසින් නිශ්චය කරන්නේ නම් එය අදහස් වේ.";

(4) එහි (2) වන උපවගන්තියේ "අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව මුදල් මණ්ඩලය විසින්" යන වචන වෙනුවට "මහ බැංකුව විසින්" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(5) එහි (2) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස එකතු කිරීමෙන්:-

"(3) මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවල පටහැනිව කුමක් සඳහන් වුව ද, (1ඇ) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති යම් පුද්ගලයකු, හවුල් ව්‍යාපාරයක් හෝ සංස්ථාපිත මණ්ඩලයක් විසින් (1ඇ) වන උපවගන්තිය උල්ලංඝනය කරමින් හෝ එම උපවගන්තිය යටතේ ප්‍රදානය කරන ලද අනුමතයේ යම් නියම හෝ කොන්දේසි උල්ලංඝනය කරමින් බලපත්‍රලාභී වාණිජ බැංකුවක වැදගත් අයිතිවාසිකම අත්පත් කරගෙන ඇති බවට එම බලපත්‍රලාභී වාණිජ බැංකුව විසින් දෙන ලද තොරතුරු මත හෝ මහ බැංකුව විසින් සොයාගත් තොරතුරු මත මහ බැංකුව සෑහීමට පත්වන අවස්ථාවක, මහ බැංකුව විසින්, අවස්ථාවෝචිත පරිදි, සුදුසු යයි සැලකිය හැකි යම් නියම හෝ කොන්දේසිවලට යටත්ව, එම බලපත්‍රලාභී වාණිජ බැංකුවට හෝ එම පුද්ගලයාට, හවුල් ව්‍යාපාරයට හෝ සංස්ථාපිත මණ්ඩලයට කරුණු කියා පෑමට අවස්ථාවක් ලබා දී එම වැදගත් අයිතිවාසිකම් බැහැර කරන ලෙස එම බැංකුවට හෝ එම පුද්ගලයාට, හවුල් ව්‍යාපරයට හෝ සංස්ථාපිත මණ්ඩලයට විධාන කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

(4) (3) වන උපවගන්තිය යටතේ බැහැර කිරීම බලාත්මක වන තෙක්, මහ බැංකුව විසින්, අවස්ථාවෝචිත පරිදි, ඒ වැදගත් අයිතිවාසිකම අත්පත් කරගනු ලැබ ඇත්තේ යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවකින් ද ඒ බලපත්‍රලාභී වාණිජ බැංකුව වෙත හෝ මේ වගන්තියේ විධිවිධාන උල්ලංඝනය කර ඇත්තේ යම් පුද්ගලයකු, හවුල් ව්‍යාපාරයක් හෝ සංස්ථාපිත මණ්ඩලයක් විසින් ද, ඒ පුද්ගලයා, හවුල් ව්‍යාපාරය හෝ සංස්ථාපිත මණ්ඩලය වෙත හෝ ඒ බැංකුව සහ ඒ පුද්ගලයා, හවුල් ව්‍යාපාරය හෝ සංස්ථාපිත මණ්ඩලය යන දෙපාර්ශ්වයටම පහත දැක්වෙන කාරණාවලින් එකක් හෝ ඊට වැඩි ගණනක් බලාත්මක කරන ලෙසට විධානය කරනු ලැබිය හැකි ය :-

(අ) එවැනි කොටස් දැරීමකට හෝ එම කොටස් දැරීමේ යම් කොටසකට ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය ක්‍රියාත්මක කිරීම, සඳහා ඇති හිමිකම අත්හිටුවීම;

(ආ) වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, එම බලපත්‍රලාභී වාණිජ බැංකුවට එවැනි කොටස් දැරීමක හෝ එම කොටස් දැරීමෙන් යම් කොටසකට අදාළ වන යම් බෙදාහැරීමේ අයිතිවාසිකමක් උපචිත වීම තහනම් කිරීම;

(ඇ) (1ඇ) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කර ඇත්තේ යම් පුද්ගලයකු, හවුල් ව්‍යාපාරයක් හෝ සංස්ථාපිත මණ්ඩලයක් විසින් ද, එම පුද්ගලයා, හවුල් ව්‍යාපාරය හෝ සංස්ථාපිත මණ්ඩලය වෙත තවදුරටත් කොටස් නිකුත් කිරීමෙන් හෝ පුද්ගලයා, හවුල් ව්‍යාපාරය හෝ සංස්ථාපිත මණ්ඩලය විසින් කරන ලද යම් අර්පණයක් ක්‍රියාවෙහි යෙදවීමෙන් බලපත්‍රලාභී වාණිජ බැංකුව වැළැක්වීම;

(ඈ) ඇවර කිරීමක දී හැර, (1ඇ) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කර ඇත්තේ යම් පුද්ගලයකු, හවුල් ව්‍යාපාරයක් හෝ සංස්ථාපිත මණ්ඩලයක් විසින් ද, එම පුද්ගලයාට, හවුල් ව්‍යාපාරයට හෝ සංස්ථාපිත මණ්ඩලයට අයවිය

යුතු යම් ආකාරයේ බෙදාහැරීමක් ඇතුළුව යම් මුදල් ප්‍රමාණයක් ගෙවීමෙන් බලපත්‍රලාභී වාණිජ බැංකුව වැළැක්වීම;

(ඉ) මහ බැංකුව විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි වූ යම් ආකාරයකට, (1ඈ) වන උපවගන්තිය උල්ලංඝනය කර අත්පත් කරගත් යම් කොටස් දැරීම්වල වැඩිදුරටත් වූ තොරතුරු මහ බැංකුව වෙත සැපයීම; හෝ

(ඊ) යම් කොටස් හිමියකු විසින් වැදගත් අයිතිවාසිකමක අතිරික්ත වශයෙන් දරන ලද කොටස් විකිණීමේ දී, ඒ සම්බන්ධයෙන් මහ බැංකුව විසින් තවදුරටත් උපදෙස් නිකුත් කරන තෙක්, එම අතිරික්තය ස්වකීය කොටස් ගිණුමේ අගුලු දැමූ ශේෂයක් ලෙසට සීමාවක් පනවන මෙන් මහ බැංකුව විසින් බලපත්‍රලාභී ව්‍යාපාර වස්තු හුවමාරුවෙන් හෝ මධ්‍යම තැන්පතු ඒකකයෙන් ඉල්ලා සිටීම.".

11. ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) එහි (1) වන උපවගන්තියේ, "අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව, බලපත්‍රලාභී වාණිජ බැංකුවේ ශාඛාවක්, නියෝජිතායතනයක් හෝ කාර්යාලයක් වසා දැමීම ඇතුළුව, අනුමතිය අස් කර ගැනීම හෝ 12 වන වගන්තිය යටතේ දෙන ලද අනුමතයක නියම සහ කොන්දේසි මුදල් මණ්ඩලය විසින්" යන වචන සහ ඉලක්කම් වෙනුවට "බලපත්‍රලාභී වාණිජ බැංකුවේ ශාඛාවක්, නියෝජිතායතනයක් හෝ කාර්යාලයක් වසා දැමීම ඇතුළුව, අනුමතය අස්කර ගැනීම හෝ 12 වන වගන්තිය යටතේ දෙන ලද අනුමතයක නියම සහ කොන්දේසි මහ බැංකුව විසින්" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(2) එහි (3) වන උපවගන්තියේ, "මුදල් මණ්ඩලය වෙත යොමු කරන ලද විරෝධතා සලකා බැලීමෙන් පසු අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව, මුදල් මණ්ඩලය විසින්-" යන වචන වෙනුවට "මහ බැංකුව වෙත යොමු කරන ලද විරෝධතා සලකා බැලීමෙන් පසු මහ බැංකුව විසින්-" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය සංශෝධනය කිරීම

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තියේ (4) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(4අ) නියමිත දිනට යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවකට හෝ එහි බැංකු සමූහයට සේවා සැපයීමක් නොකරන මූල්‍ය නොවන පාලිත සමාගමක් පවතින එම බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් එම පාලිත සමාගමේ ස්කන්ධ කොටස් ප්‍රාග්ධනයට ඇති එම බැංකුවේ හිමිකාරීත්වය විකිණීමේ තීරණය සහ එම පාලිත සමාගම විසින් කරගෙන ගිය ව්‍යාපාර එම බැංකුව විසින් නතර කරන ආකාරය පිළිබඳව මහ බැංකුවට දැනුම් දීමෙන් පසුව නියමිත දිනයේ සිට අවුරුදු පහක කාලසීමාවක් ඇතුළත එම පාලිත සමාගමේ ස්කන්ධ කොටස් ප්‍රාග්ධනයට ඇති එම බැංකුවේ හිමිකාරිත්වය අත්හැරීම සිදු කළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය සංශෝධනය කිරීම

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (1) වන උපවගන්තියේ (ආ) වන ඡේදයේ, "අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව කලින් කල නිශ්චය කරනු ලැබිය හැකි" යන වචන වෙනුවට "කලින් කල, නිශ්චය කරනු ලැබිය හැකි" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එහි (3) වන උපවගන්තියේ (ඇ) වන ඡේදය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"(ඇ) යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවකට යම් විචල්‍යතාවයකින් එහි ස්කන්ධ ප්‍රාග්ධනය වැඩිකර ගැනීමට නියම කරන අවස්ථාවක, මහ බැංකුවට අයදුම් කිරීමෙන් පසු එම බලපත්‍රලාභී වාණිජ බැංකුවට එකී නියමයන් සමඟ අනුකූල වීම සඳහා මාස දොළහක කාලසීමාවක් හෝ මහ බැංකුව විසින් ප්‍රදානය කරනු ලැබිය හැකි පරිදි වෙනත් යම් කාලසීමාවක් ලබාදෙනු ලැබිය යුතු ය.";

(3) එහි (7) වන උපවගන්තියේ (ආ) වන ඡේදය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:

"(ආ) මහ බැංකුව විසින්, (අ) වන ඡේදයේ දක්වා ඇති ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතයේ යම් විචල්‍යතාවයක් සෑම බලපත්‍රලාභී වාණිජ

බැංකුවවලට ලිඛිතව දැනුම් දෙනු ලැබිය යුතු ය. එසේ වුව ද, එවැනි විචල්‍යතාවයකින් ස්වකීය ප්‍රාග්ධනය වැඩිකර ගැනීමට නියම කර ඇති සෑම බලපත්‍රලාභී වාණිජ බැංකුවකට ම එම නියමයට අනුකූල වීම සඳහා මාස දොළහක කාලසීමාවක් හෝ මහ බැංකුව විසින් ප්‍රදානය කරනු ලැබිය හැකි පරිදි වෙනත් යම් කාලසීමාවක් ලබා දිය යුතු ය.";

(4) එහි (9) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස එකතු කිරීමෙන්:-

"(10) බලපත්‍රලාභී වාණිජ බැංකුවක ව්‍යාපාර කටයුතුවල දී උද්ගත විය හැකි විශේෂ අවදානම් තත්ත්වයන් සැලකිල්ලට ගනිමින් සුදුසු යයි මහ බැංකුව විසින් සලකනු ලැබිය හැකි පරිදි වූ අතිරේක ප්‍රාග්ධනයක් පවත්වාගෙන යන ලෙසට මහ බැංකුව විසින් ඒ බලපත්‍රලාභී වාණිජ බැංකුවට නියම කරනු ලැබිය හැකි ය.".

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය මෙයින් ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම

"ද්‍රවශීල වත්කම්

21. (1) සෑම බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් ම, සියලු අවස්ථාවන්හි දී, මහ බැංකුව විසින්, කලින් කල, නිශ්චය කරනු ලබන ආකාරයට ස්වකීය බැරකම් සපුරාලීමට නියමිත ද්‍රවශීල වත්කම් පවත්වාගෙන යා යුතු අතර, නියාමන අවශ්‍යතාවන්ගේ වර්ධනය සැලකිල්ලට ගනිමින් ද්‍රවශීලතාවය සඳහා වන නියමයන් සමග අනුකූල විය යුතු ය. මහ බැංකුව විසින්, හැකිතාක් දුරට ප්‍රායෝගික වන පරිදි, එම බලපත්‍රලාභී වාණිජ බැංකුවේ ද්‍රවශීලතා නියමයන් සඳහා අදාළ වන ජාත්‍යන්තර ප්‍රමිති උපයෝගි කර ගනු ලැබිය යුතු ය

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවලට අගතියක් නොමැතිව, මහ බැංකුව විසින්, කලින් කල, යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් බැරකම් සපුරාලීම සඳහා පවත්වාගෙන යාමට

නියමිත අතිරේක ද්‍රවශීල වත්කම් නිශ්චය කරනු ලැබිය හැකි අතර, මහ බැංකුව විසින් විධානය කරනු ලැබිය හැකි පරිදි යම් අනුපාතයකින් එම වත්කම් පවත්වාගෙන යාම සෑම බලපත්‍රලාභී වාණිජ බැංකුවකම කාර්යය වන්නේ ය.".

*ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම*

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය මෙයින් ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරනු ලැබේ:-

*"ලාභාංශ ගෙවීම*

22. මහ බැංකුව විසින්, කලින් කල, බලපත්‍රලාභී වාණිජ බැංකුවක ප්‍රාග්ධනය හෝ ද්‍රවශීල මට්ටම් සැලකිල්ලට ගනිමින් කොටස් ලෙස හෝ අන්‍යාකාරයකින්, ලාභාංශ ප්‍රකාශයට පත් කිරීමට හෝ ගෙවීමට පෙරාතුව ම හෝ ශ්‍රී ලංකාව තුළ උපයන ලද ලාභාංශ ශ්‍රී ලංකාවෙන් පිටතට පැවරීමට පෙරාතුව ම එම බලපත්‍රලාභී වාණිජ බැංකුව විසින් සපුරාලිය යුතු කොන්දේසි පනවමින් එම බලපත්‍රලාභී වාණිජ බැංකුවට විධාන නිකුත් කරනු ලැබිය හැකි ය.".

*ප්‍රධාන ප්‍රඥප්තියේ 22අ වන වගන්තිය ඇතුළත් කිරීම*

**16.** ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එම ප්‍රඥප්තියේ 22අ වන වගන්තිය ලෙස බලපවත්වනු ලැබිය යුතු යː-

*"අක්වෙරළ බැංකු ව්‍යාපාරවල දී භාවිත කළ යුතු විදේශ ව්‍යවහාර මුදල් මහ බැංකුව විසින් නම් කළ යුතු බව*

22අ. මහ බැංකුව විසින්, නියමයක් මගින් අක්වෙරළ බැංකු ව්‍යාපාර කරගෙන යාමේ කාර්යය සඳහා යම් විදේශීය ව්‍යවහාර මුදලක් නම් කරනු ලැබිය හැකි ය.".

*ප්‍රධාන ප්‍රඥප්තියේ IV වන කොටස ඉවත් කිරීම*

**17.** ප්‍රධාන ප්‍රඥප්තියේ IV වන කොටස මෙයින් ඉවත් කරනු ලැබේ.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 35 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම*

**18.** ප්‍රධාන ප්‍රඥප්තියේ 35 වන වගන්තිය මෙයින් ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරනු ලැබේ:-

"බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් මූල්‍ය ප්‍රකාශන සකස් කළ යුතු බව

35. සෑම බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් ම ගිණුම් සහ වාර්තා පවත්වාගෙන යාම සහ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව කළ යුතු ය. බලපත්‍රලාභී වාණිජ බැංකුවක මූල්‍ය ප්‍රකාශනවලින් බැංකුවේ ක්‍රියාකාරකම්වල සත්‍ය සහ නිවැරදි තක්සේරුවක් නිරූපණය විය යුතු අතර, තනි සහ ඒකාබද්ධ පදනම යන දෙක ම මත බැංකුවේ මෙහෙයුම් සහ මූල්‍ය තත්ත්වය පිළිඹිඹු විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 36 වන වගන්තිය ඉවත් කිරීම

**19.** ප්‍රධාන ප්‍රඥප්තියේ 36 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තිය ඉවත් කිරීම

**20.** ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම

**21.** ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තිය මෙයින් ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරනු ලැබේ:-

"බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් මූල්‍ය ප්‍රකාශන ප්‍රකාශයට පත් කිරීම

38. (1) ශ්‍රී ලංකාව ඇතුළත සංස්ථාගත කරන ලද හෝ පිහිටුවන ලද සෑම බලපත්‍රලාභී වාණිජ බැංකුවක් ම-

(අ) එම බැංකුවේ මුදල් වර්ෂය අවසන් වීමෙන් පසුව මාස තුනක් ඇතුළත, එම බැංකුවේ ශ්‍රී ලංකාව තුළ සහ ඉන් පිටත ව්‍යාපාර සම්බන්ධයෙන් එම මුදල් වර්ෂය සඳහා තනි සහ ඒකාබද්ධ පදනම මත එම බැංකුවේ විගණනය කළ මූල්‍ය ප්‍රකාශන බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා වෙත, සම්ප්‍රේෂණය කළ යුතු ය;

(ආ) එළඹෙන මුදල් වර්ෂය සඳහා තනි සහ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සකස් කර ප්‍රදර්ශනය කරනු ලබන තෙක් එම බැංකුවේ එක් එක් ව්‍යාපාරික ස්ථානවල ප්‍රකටව පෙනෙන

ස්ථානයක එම මූල්‍ය ප්‍රකාශන ප්‍රදර්ශනය කළ යුතු ය; සහ

(ඇ) (අ) වන ඡේදයේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාව තුළ අවම වශයෙන් එක් වතාවක්වත් එම ප්‍රකාශන ශ්‍රී ලංකාව තුළ දිනපතා සංසරණය වන, අවම වශයෙන් එක් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි පුවත්පතක සහ අදාළ බැංකුවේ නිල වෙබ් අඩවියෙහි පළ කළ යුතු ය.

(2) ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කරන ලද සෑම බලපත්‍රලාභී වාණිජ බැංකුවක් ම -

(අ) එම බැංකුවේ මුදල් වර්ෂය අවසන් වීමෙන් පසුව මාස තුනක් ඇතුළත, එම බැංකුවේ ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාර සම්බන්ධයෙන් එම මුදල් වර්ෂය සඳහා එහි විගණනය කළ මූල්‍ය ප්‍රකාශන බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා වෙත සම්ප්‍රේෂණය කළ යුතු ය;

(ආ) එළඹෙන මුදල් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සකස් කර ප්‍රදර්ශනය කරනු ලබන තෙක් එම බැංකුවේ එක් එක් ව්‍යාපාරික ස්ථානවල ප්‍රකටව පෙනෙන ස්ථානයක එම මූල්‍ය ප්‍රකාශන ප්‍රදර්ශනය කළ යුතු ය; සහ

(ඇ) (අ) වන ඡේදයේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාව තුළ අවම වශයෙන් එක් වතාවක්වත් එම ප්‍රකාශන ශ්‍රී ලංකාව තුළ දිනපතා සංසරණය වන, අවම වශයෙන් එක් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි පුවත්පතක සහ අදාළ බැංකුවේ නිල වෙබ් අඩවියෙහි පළ කළ යුතු ය.

(3) කළ යුතු යම් හෙළිදරව් කිරීමේ නියමයන් ඇතුළුව, (1) වන සහ (2) වන උපවගන්තිවල දක්වා ඇති මූල්‍ය ප්‍රකාශනවල ආකෘතිය මහ බැංකුව විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි අතර, එම ආකෘතිය නිශ්චිතව දක්වා ඇති අවස්ථාවක, සෑම බලපත්‍රලාභී වාණිජ බැංකුවක් ම මූල්‍ය ප්‍රකාශන එම ආකෘතියෙන් පිළියෙල කරනු ලැබිය යුතු ය.

(4) (3) වන උපවගන්තිය යටතේ කරන ලද හෙළිදරව් කිරීමක අන්තර්ගත විය යුතු බවට නියම කර ඇති තොරතුරු අන්තර්ගත නොවන බවට හෝ එම හෙළිදරව් කිරීම අන්‍යාකාරයකින් අසත්‍ය හෝ නොමග යවනසුලු බවට මහ බැංකුව විසින් නිශ්චය කරනු ලබන අවස්ථාවක, මහ බැංකුව විසින්, ලිඛිත නිවේදනයක් මගින් -

(අ) පූර්වයෙන් පැහැර හරින ලද තොරතුරු ද ඇතුළත් වන හෙළිදරව් කිරීමේ ප්‍රකාශයක් පළ කරන ලෙස;

(ආ) අසත්‍ය හෝ නොමග යවනසුලු තොරතුරු ඇතුළත් කිරීමෙන් තොරව හෙළිදරව් කිරීමේ ප්‍රකාශයක් පළ කරන ලෙස; හෝ

(ඇ) නිවේදනයේ නිශ්චිතව දක්වනු ලැබිය හැකි පරිදි වෙනත් යම් නිවැරදි කිරීමේ පියවරක් ගනු ලබන ලෙස,

එම බැංකුව වෙත නියම කරනු ලැබිය හැකි ය.".

**22.** ප්‍රධාන ප්‍රඥප්තියේ 39 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 39 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) එහි (1) වන උපවගන්තියේ -

(අ) (අ) වන ඡේදයේ "ගිණුම්, ශේෂ පත්‍රය සහ ලාභලාභ ගිණුම්" යන වචන වෙනුවට "මූල්‍ය ප්‍රකාශන" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) (ආ) වන ඡේදයේ "ගිණුම්, ශේෂ පත්‍රය සහ ලාභාලාභ ගිණුම්" යන වචන වෙනුවට "මූල්‍ය ප්‍රකාශන" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එහි (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන්:-

"(1අ) මේ පනත යටතේ ස්වකීය කාර්ය ඉටු කිරීමේ දී විගණකවරයාගේ දැනීම අනුව -

(අ) යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක ප්‍රමාණාත්මක ලෙස ප්‍රාග්ධනය අඩු කළ හැකි අලාභයක් සිදු වී ඇති බවට හෝ අලාභයක් සිදුවීමට ප්‍රවණතාවක් ඇති බවට;

(ආ) ස්වකීය ව්‍යාපාර කරගෙන යෑමේ දී, සිය තැන්පත්කරුවන්ගේ සහ ණයහිමියන්ගේ සුබසිද්ධියට අහිතකර වන ආකාරයට එම බැංකුව විසින් නුසුදුසු හෝ අනාරක්ෂිත පිළිවෙත්වල නිරතවීම ඇතුළත්ව එම බැංකුවෙහි අක්‍රමිකතා සිදුව ඇති බවට; හෝ

(ඇ) එම බැංකුවේ වත්කම් මගින් එම බැංකුවේ තැන්පත්කරුවන් සහ ණයහිමියන් වෙත පවතින වගකීම් ප්‍රමාණවත් ලෙස ආවරණය කර නොමැති බවට,

සොයා ගැනීම් ඇති අවස්ථාවක, එම විගණකවරයා විසින්, එම බලපත්‍රලාභී වාණිජ බැංකුවේ සුරක්ෂිත බව හා ශක්තිමත්භාවයට ප්‍රමාණාත්මක ලෙස බලපාන එවැනි සොයා ගැනීම් හෝ වෙනත් අනෙකුත් කාරණා බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා වෙත වහාම වාර්තා කරනු ලැබිය යුතු ය.";

(3) එහි (2) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"(2) මුදල් වර්ෂය අවසානයේ මාස දෙකක් ඇතුළත සම්පූර්ණ කරනු ලැබිය යුතු, (1) වන

උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති සෑම වාර්තාවක ම, මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා සහ හෙළිදරව් කිරීම් සිදු කිරීම සඳහා අදාළ විධිවිධානවලට බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් අනුකූල වීම ඇතුළත්ව බැංකුවේ මූල්‍ය තත්ත්වයෙහි සත්‍ය සහ සාධාරණ සමාලෝචනයක් මූල්‍ය ප්‍රකාශනවල අන්තර්ගත වන්නේ ද නැද්ද යන්න පිළිබඳව විගණකවරයාගේ මතය සහ විගණකවරයා විසින් එම බලපත්‍රලාභී වාණිජ බැංකුවේ යම් නිලධරයකුගෙන් හෝ නියෝජිතයකුගෙන් යම් පැහැදිලි කර ගැනීමක් හෝ යම් තොරතුරක් ඉල්ලා ඇති අවස්ථාවක, එම පැහැදිලි කිරීම හෝ තොරතුර සතුටුදායක වන්නේ ද නැද්ද යන්න පිළිබඳව විගණකවරයා විසින් ඉදිරිපත් කරනු ලබන ප්‍රකාශයක් අන්තර්ගත විය යුතු ය.";

(4) එහි (3අ) වන උපවගන්තියේ "ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දැරිය යුතු ය." යන වචන වෙනුවට "අදාළ බලපත්‍රලාභී වාණිජ බැංකුව විසින් දැරිය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන්;

(5) එහි (3අ) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන්:-

"(3ආ) බලපත්‍රලාභී වාණිජ බැංකුවක ව්‍යාපාර සහ ක්‍රියාකාරකම්වල එක් පැතිකඩක හෝ ඊට වඩා වැඩි පැතිකඩ පිළිබඳව අතිරේක විගණනයක් පැවැත්වීම අවශ්‍ය බව මහ බැංකුවේ අදහස වන අවස්ථාවක, එම පැතිකඩ පිළිබඳව අතිරේක විගණනයක් පවත්වන ලෙස බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා විසින් එම බැංකුව වෙත නියම කරනු ලැබිය හැකි අතර, එම අතිරේක විගණනයේ පිරිවැය අදාළ බලපත්‍රලාභී වාණිජ බැංකුව විසින් දරනු ලැබිය යුතු ය.

(3ඇ) මේ වගන්තිය යටතේ අතිරේක විගණනයක් පැවැත්වීම සඳහා සේවයේ නියුක්ත කර ඇති යම් විගණකවරයෙක් සම්බන්ධයෙන් විගණකවරයන් පත් කිරීම, ඔවුන්ගේ කාර්ය සහ බලතල මෙන්ම පාරිශ්‍රමිකවලට අදාළ 38අ වන සහ 39 වන වගන්තිවල විධිවිධාන, අවශ්‍ය වෙනස්කම් සහිතව, අදාළ විය යුතු ය.";

(6) එහි (7) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන්:-

"(7අ) බලපත්‍රලාභී වාණිජ බැංකුවක විගණනය භාර හවුල්කරුවා ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ සාමාජිකයකු විය යුතු අතර, විගණකවරයකු වශයෙන් පත් කරනු ලැබීමේ දී ශ්‍රී ලංකාවේ හෝ විදේශීය රටක යම් ලිඛිත නීතියක් යටතේ වූ යම් නුසුදුසුකමකට යටත් නොවිය යුතු ය.

(7ආ) සෑම බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් ම සෑම වසර හයකට වරක්ම එම බැංකුවේ විගණකවරයා වෙනස් කරනු ලැබිය යුතු අතර, සෑම වසර තුනකට වරක්ම විගණනය භාර හවුල්කරුවා වෙනස් කරනු ලැබිය යුතු ය.

(7ඇ) දැනටමත් විගණකවරයකු පත් කර ඇති බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් නියමිත දිනයේ සිට අවුරුදු දෙකක කාලසීමාවක් ඇතුළත මේ වගන්තියේ විධිවිධානවලට අනුකූල විය යුතු ය."; සහ

(7) එහි (8) වන උපවගන්තිය ඉවත් කිරීමෙන්.

**23.** ප්‍රධාන ප්‍රඥප්තියේ 41 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ "යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් හෝ එහි යම් පාලිත සමාගමක්" යන වචන වෙනුවට "යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් තනි හෝ ඒකාබද්ධ පදනමක් මත" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 41 වන වගන්තිය සංශෝධනය කිරීම

**24.** ප්‍රධාන ප්‍රඥප්තියේ 42 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 42 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) එහි (2) වන උපවගන්තියේ-

(අ) (අ) වන ඡේදය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"(අ) එම තැනැත්තාට බැංකු කටයුතු, මූල්‍ය, ආර්ථික විද්‍යාව, ගණකාධිකරණය, ව්‍යාපාර පරිපාලනය, තොරතුරු තාක්ෂණය, අවදානම් කළමනාකරණය, නීතිය හෝ මහ බැංකුව විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි වෙනත් යම් අදාළ විෂයයක් පිළිබඳ අධ්‍යයන හෝ වෘත්තීය සුදුසුකම් සහ සක්‍රිය පළපුරුද්දක් ඇති බවට;";

(ආ) (ඇ) වන ඡේදය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"(ඇ) ශ්‍රී ලංකාවේ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත නීතිය මගින් පිහිටුවනු ලබන යම් අධිකරණයක්, විනිශ්චය අධිකාරයක්, නියාමන අධිකාරියක්, අධීක්ෂණ අධිකාරියක්, වෘත්තීමය සංගමයක්, පරීක්ෂණ කොමිෂන් සභාවක් හෝ වෙනත් යම් ආයතනයක් විසින් වංචාව, රැවටීම, වංක ක්‍රියාවක් හෝ වෙනත් යම් සමාන අපරාධ ක්‍රියාවක් සංයුක්තවන චෝදනාවක් පිළිබඳ දැන්වීමක් භාරදීම මත එම තැනැත්තා යම් නඩු කටයුත්තකට, පරීක්ෂණයකට හෝ විමර්ශනයකට යටත්ව නොමැති බවට.";

(2) එහි (4) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"(4) සෑම බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් ම බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි වූ ආකෘති පත්‍රයක -

(අ) අවස්ථාවෝචිත පරිදි, එම බලපත්‍රලාභී වාණිජ බැංකුවේ අධ්‍යක්ෂවරයකු ලෙස පත් කිරීමට, තෝරා පත් කර ගැනීමට හෝ නාමයෝජනා කිරීමට පෙරාතුව එසේ පත් කිරීමට, තෝරා පත් කර ගැනීමට හෝ නම් කිරීමට යෝජිත එක් එක් තැනැත්තාගේ නම, ලිපිනය සහ රැකියාව මෙන්ම බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා විසින් අවශ්‍ය බවට සලකන්නේ නම් එම තැනැත්තා පිළිබඳ තවදුරටත් වූ යම් තොරතුරු;

(ආ) එම බලපත්‍රලාභී වාණිජ බැංකුවේ යම් අධ්‍යක්ෂවරයකු නිසි සහ සුදුසු තැනැත්තකු නොවන බවට හෝ එම අධ්‍යක්ෂවරයා, අධ්‍යක්ෂවරයකු ලෙස ධුරය දැරීමට අනන්‍යාකාරයකින් නුසුදුසු තැනැත්තකු බවට එම බැංකුව විසින් දැනගනු ලබන අවස්ථාවක, එම බැංකුව විසින් එම කරුණු දැනගත් දින සිට දින පහළොවක් ඇතුළත, එම

අධ්‍යක්ෂවරයාගේ නම, ලිපිනය සහ රැකියාව මෙන්ම බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා විසින් අවශ්‍ය බවට සලකන්නේ නම් එම තැනැත්තා පිළිබඳ තවදුරටත් වූ යම් තොරතුරු,

බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා වෙත දැනුම් දිය යුතු ය.";

(3) එහි (4) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන්:-

"(4අ) (4) වන උපවගන්තිය යටතේ යම් දැන්වීමක් ලැබීමෙන් පසුව, බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා විසින් අවශ්‍ය බවට සලකන්නේ නම්, (1) වන හෝ (2) වන උපවගන්තියේ දක්වා ඇති යම් කාරණා සම්බන්ධයෙන් තමා විසින් සෑහීමට පත්වීම පිණිස තවදුරටත් වූ විමර්ශනයක් පැවැත්වීමට කටයුතු සලස්වනු ලැබිය හැකි ය.";

(4) එහි (7) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"(7) (5) වන උපවගන්තිය හෝ (6) වන උපවගන්තිය යටතේ, අවස්ථාවෝචිත පරිදි, ස්වකීය පත්වීම, තෝරා පත් කර ගැනීම හෝ නාමයෝජනා කිරීම අනුමත වී නොමැත්තේ යම් තැනැත්තකුගේ ද, එම තැනැත්තා බලපත්‍රලාභී වාණිජ බැංකුවක අධ්‍යක්ෂවරයකු වශයෙන් පත් කිරීම, තෝරා පත් කර ගැනීම හෝ නාමයෝජනා කිරීම කරනු නොලැබිය යුතු ය. එවැනි කිසිදු අධ්‍යක්ෂවරයකුට එවැනි බලපත්‍රලාභී වාණිජ බැංකුවක කවර හෝ තත්ත්වයකින් යම් කාර්යයක් හෝ කර්තව්‍යයක් ඉටු කිරීමට අවසර ලබා නොදිය යුතු ය.";

(5) එහි (12) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"(12) යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක පාලන ව්‍යුහය ඇතුළුව එවැනි බැංකුවක ක්‍රියාකාරකම් කළමනාකරණය පිළිබඳව අධීක්ෂණය කිරීමේ කාර්යය බලපත්‍රලාභී වාණිජ බැංකුවක අධ්‍යක්ෂ මණ්ඩලයට තිබිය යුතු මෙන්ම එම බැංකුවේ ව්‍යාපාර අදාළ සියලු නීතිවලට අනුකූලව කරගෙන යනු ලබන බවට සහ සුරක්ෂිත සහ ශක්තිමත් බැංකු පරිචයන්ට අනුකූලව සිදුවන බවට සහතික වීම සම්බන්ධයෙන් එම බලපත්‍රලාභී වාණිජ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අවසාන වශයෙන් වගකියනු ලැබිය යුතු ය."; සහ

(6) එහි (12) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස එකතු කිරීමෙන්:-

"(13) වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, බලපත්‍රලාභී වාණිජ බැංකුවක අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන් ගණන මහ බැංකුව විසින්, කලින් කල, නිශ්චය කරනු ලැබිය යුතු අතර, එම ගණන සෑම අවස්ථාවක දී ම, සාමාජිකයන් හත්දෙනකුට අඩු නොවිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 44අ වන වගන්තිය සංශෝධනය කිරීම

**25.** ප්‍රධාන ප්‍රඥප්තියේ 44අ වන වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(1) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි බලපත්‍රලාභී වාණිජ බැංකුවක ප්‍රධාන විධායක නිලධරයා සහ විධායක කර්තව්‍ය ඉටු කරනු ලබන වෙනත් යම් නිලධරයන් එකී අදාළ තනතුරු දැරීම සඳහා නිසි සහ සුදුසු තැනැත්තන් විය යුතු අතර, එම තැනැත්තන් නිසි සහ සුදුසු තැනැත්තන් ද යන්න නිශ්චය කිරීමේ දී 42 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ කරගනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 44ආ සහ 44ඇ වන වගන්ති ඇතුළත් කිරීම

**26.** ප්‍රධාන ප්‍රඥප්තියේ 44අ වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එම වගන්ති එම ප්‍රඥප්තියේ 44ආ වන සහ 44ඇ වන වගන්ති ලෙස බලාත්මක විය යුතු යː-

"බලපත්‍රලාභී වාණිජ බැංකුවක කලින් අධ්‍යක්ෂවරයකු, ප්‍රධාන විධායක නිලධරයා හෝ එම බැංකුවේ විධායක කර්තව්‍ය ඉටු කරනු ලබන නිලධරයකු යන ධුර දරන ලද තැනැත්තකු එම ධුර දරන තැනැත්තකු වීමට නුසුදුසු වීම

44ආ. (1) (අ) මහ බැංකුව විසින්, බලපත්‍රලාභී වාණිජ බැංකුවක කටයුතු පිළිබඳව පවත්වන ලද යම් පරීක්ෂණයක හෝ විමර්ශනයක සොයා ගැනීම් ප්‍රකාරව, එම බැංකුවේ අධ්‍යක්ෂවරයකු, ප්‍රධාන විධායක නිලධරයා හෝ විධායක කර්තව්‍ය ඉටු කරන නිලධරයකු වශයෙන් පෙර කවර හෝ අවස්ථාවක ධුර දරා ඇති තැනැත්තකු විසින්, එම ධුරයේ සේවය කරන ලද කාලසීමාව අතරතුර බලපත්‍රලාභී වාණිජ බැංකුවක හෝ මහ බැංකුව විසින් නියාමනය කරන ලද සහ අධීක්ෂණය කරන ලද වෙනත් යම් මූල්‍ය ආයතනයක අධ්‍යක්ෂවරයකු, ප්‍රධාන විධායක නිලධරයා හෝ විධායක කර්තව්‍ය ඉටු කරන නිලධරයකු වශයෙන් පත් කිරීමට, තෝරා පත්

කිරීමට හෝ නාමයෝජනා කරනු ලැබීමට නිසි සහ සුදුසු තැනැත්තකු ලෙස සුදුසුකම් නොලැබීමට ඉඩ ඇති වංචාවකට, රැවටීමකට, වංක ක්‍රියාවකට හෝ වෙනත් සමාන අපරාධ ක්‍රියාවකට හෝ වෙනත් යම් නුසුදුසු පැවැත්මකින් සංයුක්ත වන යම් ක්‍රියාවක් සිදු කර ඇති බවට හෝ එවැනි ක්‍රියාවක් සිදු කිරීමට සම්බන්ධ වී ඇති බවට මහ බැංකුව විසින් ඕනෑම අවස්ථාවක සෑහීමට පත්වන යම් අවස්ථාවක, මහ බැංකුව විසින් එම තැනැත්තා නිසි සහ සුදුසු තැනැත්තකු නොවන බවට නිශ්චය කිරීම කරනු ලබන අවස්ථාවේ දී එම තැනැත්තා තවදුරටත් එම ධුරය දරමින් නොසිටිය වුව ද එය නොතකා මහ බැංකුව විසින් එම තැනැත්තා නිසි සහ සුදුසු තැනැත්තකු නොවන බව නිශ්චය කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

(ආ) එවැනි නිශ්චය කිරීමක් ලබා දීමට පෙරාතුව එවැනි තැනැත්තකු වෙත කරුණු කියා පෑමට අවස්ථාවක් ප්‍රදානය කර ඇති බවට මහ බැංකුව විසින් සහතික විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ එසේ නිසි සහ සුදුසු නොවන තැනැත්තකු වශයෙන් නිශ්චය කර ඇති තැනැත්තකු යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක හෝ මහ බැංකුව විසින් නියාමනය කරනු ලබන සහ අධීක්ෂණය කරනු ලබන වෙනත් යම් මූල්‍ය ආයතනයක අධ්‍යක්ෂවරයකු, ප්‍රධාන විධායක නිලධරයා හෝ විධායක කර්තව්‍ය ඉටු කරනු ලබන වෙනත් යම් නිලධරයකු වශයෙන් පත් කිරීම, තෝරා පත් කර ගැනීම, නාමයෝජනා කිරීම හෝ අඛණ්ඩව ක්‍රියා කිරීම සඳහා යෝග්‍ය නොවිය යුතු ය.

අනනුකූලතාවයක දී මේ පනතේ මේ කොටස බලපැවැත්විය යුතු බව

44ඇ. මේ පනතේ මේ කොටසේ විධිවිධාන සහ තත්කාලයේ බලපවත්නා වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන අතර යම් ගැටුමක් හෝ අනනුකූලතාවක් ඇති විට, මේ කොටසේ විධිවිධාන බලපැවැත්විය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තිය සංශෝධනය කිරීම

**27.** ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) "බැංකුවල ව්‍යාපාර කටයුතුවල යම් අංශයක් පවත්වාගෙන යා යුතු ආකාරය සම්බන්ධයෙන් විධාන දෙනු ලැබිය හැකි අතර," යන වචන වෙනුවට " බැංකුවල ව්‍යාපාර කටයුතුවල යම් අංශයක් පවත්වාගෙන යා යුතු ආකාරය සම්බන්ධයෙන් එකී බැංකුවල වත්කම්වල ප්‍රමාණය, පරිමාණය, විවිධත්වය සහ මෙහෙයුම්වල සංකීර්ණ බව සැලකිල්ලට ගෙන විධාන දෙනු ලැබිය හැකි අතර," යන වචන ආදේශ කිරීමෙන්;

(2) එහි (ඇ) වන ඡේදය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"(ඇ) විශාල ගනුදෙනු නිරාවරණය සම්බන්ධයෙන් අදාළ වන ජාත්‍යන්තර ප්‍රමිති හැකිතාක් දුරට ප්‍රායෝගිකව පිළිගැනීම ඇතුළුව එවැනි බලපත්‍රලාභී වාණිජ බැංකුවක ස්කන්ධ ප්‍රාග්ධනය, සංචිත සහ තැන්පතු සහ වෙනත් අදාළ කාරණා සැලකිල්ලට ගෙන, එකී බැංකුව විසින් -

(i) යම් තනි සමාගමකට, රාජ්‍ය සංස්ථාවකට, ව්‍යාපාර ආයතනයකට, තැනැත්තන්ගේ සංගමයකට හෝ පුද්ගලයකුට; හෝ

(ii) එකතුවක් වශයෙන් -

(අ) යම් පුද්ගලයකුට, ඔහුගේ කිට්ටු ඥාතියකුට හෝ ඔහුට හෝ ඔහුගේ කිට්ටු ඥාතියකුට සැහෙන සම්බන්ධතාවක් තිබෙන සමාගමකට හෝ ව්‍යාපාර ආයතනයකට; හෝ

(ආ) පහත දැක්වෙන නිර්ණායකවලින් අවම වශයෙන් එක් නිර්ණායකයක් හෝ තෘප්ත කරන්නේ නම් සම්බන්ධිත ණයකරුවන්ගේ කණ්ඩායමකට:-

(අ) පාලන සම්බන්ධතාවක්, සමාගමක් සහ එකිනෙකට පාලන

සම්බන්ධතාවක් සහිත පහත දැක්වෙන සමාගම්වලින් එකක් හෝ කිහිපයක්:-

(i) එහි පාලිත සමාගම්;

(ii) එහි පාලක සමාගමක්;

(iii) එහි ආශ්‍රිත සමාගමක්;

(iv) එහි පාලක සමාගමේ පාලිත සමාගමක්;

(v) මේ අනු අනුඡේදයේ (අ) අයිතමයේ දක්වා ඇති සමාගමක් හෝ එහි පාලිත සමාගමක් හෝ එහි පාලක සමාගමක් හෝ එහි පාලක සමාගමේ පාලිත සමාගමක් විසින් සැලෙන සම්බන්ධතාවක් පවත්වන සමාගමක්;

(vi) එකී සමාගමට සැලෙන සම්බන්ධතාවක් සහිත යම් පුද්ගලයකු සහ එකී පුද්ගලයාගේ කිට්ටු ඥාතීන්ට; හෝ

(vii) එකී සමාගම විෂයයෙහි ඍජු හෝ වක්‍ර පාලනයක් සහිත බවට මහ බැංකුව විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි වෙනත් යම් සමාගමක්;

(ආ) පූර්ව නිශ්චිත නිර්ණායක මත පදනම්ව මහ බැංකුව විසින්

නිශ්චය කරනු ලැබිය හැකි පරිදි සම්බන්ධිත ණයකරුවන් අතර පවතින ආර්ථික අන්තර් රැඳියාවට,

සිදු කරනු ලැබිය හැකි විශාල ගනුදෙනු නිරාවරණය මත වන සීමාව සම්බන්ධයෙන්:

එසේ වුව ද, බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින්, නියමිත දින සිට අවුරුදු තුනක කාලසීමාවක් හෝ මහ බැංකුව විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි වෙනත් යම් කාලසීමාවක් ඇතුළත මේ ඡේදයේ විධිවිධානවලට අනුකූලව කටයුතු කිරීම නීත්‍යනුකූල විය යුතු ය.".

**28.** ප්‍රධාන ප්‍රඥප්තියේ 47 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 47 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) එහි (1) වන උපවගන්තිය ඉවත් කිරීමෙන්;

(2) එහි (11අ) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන්:-

"(11ආ) (3) වන, (4) වන, (5) වන, (6) වන, (7) වන, (11) වන සහ (11අ) වන උපවගන්තිවල විධිවිධාන පහත දැක්වෙන තැනැත්තන් සම්බන්ධයෙන් අදාළ විය යුතු අතර, එකී තැනැත්තන් විසින් එකී විධිවිධානවලට අනුකූලව කටයුතු කරනු ලැබිය යුතු ය:-

(අ) බලපත්‍රලාභී වාණිජ බැංකුවක සේවානියුක්තයන්ට අදාළ වන යෝජනා ක්‍රමයක් යටතේ එම බලපත්‍රලාභී බැංකුවේ ප්‍රධාන විධායක නිලධරයකු හෝ විධායක කර්තව්‍ය ඉටු කරන නිලධරයකුට ප්‍රදානය කරනු ලබන යම් අනුග්‍රහයක් හැර, ප්‍රදානය කරන ලද යම් අනුග්‍රහයක් සම්බන්ධයෙන් එවැනි යම් නිලධරයකු;

(ආ) පුද්ගලයකු හෝ ආයතනයක් වුව ද, බලපත්‍රලාභී වාණිජ බැංකුවක වැදගත් අයිතිවාසිකමක් සහිත කොටස් හිමියකු;

(ඇ) බලපත්‍රලාභී වාණිජ බැංකුවේ පාලිත සමාගමක් හෝ ආශ්‍රිත සමාගමක්;

(ඈ) ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කරන ලද බැංකුවක මව් බැංකුවක් සහ පාලිත සමාගම් හැර, බලපත්‍රලාභී වාණිජ බැංකුවේ පාලිත සමාගම් ඇතුළුව, එහි පාලක සමාගමක්;

(ඉ) බලපත්‍රලාභී වාණිජ බැංකුවේ පාලිත සමාගමක හෝ ආශ්‍රිත සමාගමක අධ්‍යක්ෂවරයකු සහ පාලක සමාගමක සහ එහි පාලිත සමාගම්වල අධ්‍යක්ෂවරයකු;

(ඊ) (අ) වන සහ (ආ) වන ඡේදවල නිශ්චිතව දක්වා ඇති තැනැත්තකුගේ කිට්ටු ඥාතියකු;

(උ) සිය අධ්‍යක්ෂවරයා හෝ හවුල්කරු එම බැංකුවේ අධ්‍යක්ෂවරයකු වන යම් ආයතනයක්; සහ

(ඌ) බලපත්‍රලාභී වාණිජ බැංකුවක වැදගත් කොටස් හිමියකුට හෝ ඔහුගේ යම් කිට්ටු ඥාතියකුට සැහෙන සම්බන්ධතාවක් ඇති ආයතනයක්.

(11ඇ). (3) වන, (4) වන, (5) වන, (6) වන, (7) වන, (11) වන හෝ (11අ) වන උපවගන්තිවල විධිවිධාන උල්ලංඝනය කරන (11ආ) වන උපවගන්තියේ දක්වා ඇති යම් තැනැත්තකු මේ පනත යටතේ වරදක් කරනු ලබන්නේ ය.";

(3) (13) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන්:-

"(14) (අ) මහ බැංකුව විසින්, 19 වන වගන්තියේ (7) වන උපවගන්තිය යටතේ නියාමන ප්‍රාග්ධන අනුපාත ගණනය කිරීමේ කාර්ය සඳහා බලපත්‍රලාභී වාණිජ

බැංකුවක් විසින් යම් සම්බන්ධිත පාර්ශ්වයක් වෙත (4) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති සීමාවන් ඉක්මවා ප්‍රදානය කරන ලද යම් අනුග්‍රහයේ මුදල් ප්‍රමාණය අඩු කරන ලෙසට, හෝ එම අතිරික්ත මුදල මහ බැංකුව විසින් විධාන කරනු ලබන පරිදි යම් ඇපයක් මගින් සුරක්ෂිත කරනු ලබන ලෙසට, එකී බලපත්‍රලාභී වාණිජ බැංකුව වෙත නියම කරනු ලැබිය හැකි ය.

(ආ) (අ) වන ඡේදයේ විධිවිධානවලට අනුකූල වීම සඳහා බලපත්‍රලාභී වාණිජ බැංකුවක් වෙත මහ බැංකුව විසින් ලබාදිය හැකි අවම කාලසීමාව මාස දොළහක කාලසීමාවක් හෝ මහ බැංකුව විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි වෙනත් යම් කාලසීමාවක් විය යුතු අතර, කිසිදු අවස්ථාවක දී එම කාලසීමාව අවුරුදු තුනක් නොඉක්මවිය යුතු ය.".

**29.** ප්‍රධාන ප්‍රඥප්තියේ VIIඅ වන කොටස මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ VIIඅ වන කොටස ඉවත් කිරීම

**30.** ප්‍රධාන ප්‍රඥප්තියේ 50 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 50 වන වගන්තිය ඉවත් කිරීම

**31.** ප්‍රධාන ප්‍රඥප්තියේ 55 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 55 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) "54 වන වගන්තියේ සඳහන් එහි සියලු යුතුකම් ඉටු කර ඇති බව මුදල් මණ්ඩලයේ මතය වූ අවස්ථාවක, ඒ බැංකුවේ නම, බලපත්‍රලාභී වාණිජ බැංකු ලැයිස්තුවෙන් ඉවත් කරනු ලැබිය යුතු අතර," යන වචන සහ ඉලක්කම වෙනුවට "54 වන වගන්තියේ දක්වා ඇති එහි සියලු යුතුකම් ඉටු කර ඇති බව මුදල් මණ්ඩලයේ මතය වූ අවස්ථාවක," යන වචන සහ ඉලක්කම ආදේශ කිරීමෙන්;

(2) එහි (ඇ) වන ඡේදයේ "72 වන වගන්තිය ප්‍රකාර කටයුතු කරනතුරු" යන වචන සහ ඉලක්කම වෙනුවට "72 වන වගන්තිය ප්‍රකාර කටයුතු කරනතුරු; සහ" යන වචන සහ ඉලක්කම ආදේශ කිරීමෙන්;

(3) එහි (ඇ) වන ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස එකතු කිරීමෙන්:-

"(ඈ) 54 වන වගන්තිය යටතේ නිසි අයිතිකරුවන් වෙත නොගෙවන ලද හෝ ආපසු නොදෙන ලද ආරක්ෂිත තැන්පතු පෙට්ටියක පවත්වා ගනු ලැබූ සියලු මුදල් හෝ වෙනත් භාණ්ඩ, අවස්ථාවෝචිත පරිදි, මහ බැංකුවේ විශේෂ ගිණුමකට හුවමාරු කරනු ලැබ තිබෙන තුරු හෝ එකී කාර්යය සඳහා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන විධානවලට අනුකූලව බැහැරකරන තුරු;";

(4) ඒ වගන්තියේ පැති සටහන ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"ඉතිරි වත්කම්
බලපත්‍රලාභී
වාණිජ
බැංකුවේ
අයිතිකරුවන්
අතර
බෙදාහැරීම".

32. ප්‍රධාන ප්‍රඥප්තියේ 56 වන වගන්තිය මෙයින් ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 56 වන වගන්තිය සංශෝධනය කිරීම

"බලපත්‍රලාභී වාණිජ බැංකුවක් වෙත නිකුත් කරන ලද බලපත්‍රය අවලංගු කිරීම සහ ලැයිස්තුවෙන් නම ඉවත් කිරීම

56. 55 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව ඉතිරි සියලු වත්කම් බෙදාහරිනු ලැබීමෙන් පසුව, බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා විසින්, ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීමට යටත් එකී බලපත්‍රලාභී වාණිජ බැංකුවේ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන මහ බැංකුවේ අනුමතය සඳහා මහ බැංකුව වෙත ඉදිරිපත් කරන ලෙසට එකී බැංකුව වෙත විධාන කරනු ලැබිය යුතු ය. විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන මහ බැංකුව විසින් අනුමත කරනු ලැබීමෙන් පසුව, එකී බලපත්‍රලාභී වාණිජ බැංකුව වෙත නිකුත් කරන ලද බලපත්‍රය මහ බැංකුව විසින් අවලංගු කරනු ලැබිය යුතු අතර, එකී බැංකුවේ නම බලපත්‍රලාභී වාණිජ බැංකු ලැයිස්තුවෙන් ඉවත් කරනු ලැබිය යුතු ය.".

**33.** ප්‍රධාන ප්‍රඥප්තියේ 57 සිට 69 දක්වා වන වගන්ති (එම වගන්ති දෙක ද ඇතුළුව) මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 57 සිට 69 දක්වා වන වගන්ති ඉවත් කිරීම

**34.** ප්‍රධාන ප්‍රඥප්තියේ 70 වන වගන්තිය එහි (4) වන උපවගන්තියේ "සියලු පියවර ගනු ලැබිය යුතු ය. මේ වගන්තිය යටතේ කටයුතු ගණන් බේරා වසා දැමීම පිණිස 63 වන හා 68 වන වගන්තිවල විධිවිධාන අදාළ විය යුතු ය." යන වචන සහ ඉලක්කම් වෙනුවට "සියලු පියවර ගනු ලැබිය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 70 වන වගන්තිය සංශෝධනය කිරීම

**35.** ප්‍රධාන ප්‍රඥප්තියේ 72 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ "සහ 63 වන සහ 68 වන වගන්තිවල සඳහන් කරන ලද මුදල් සහ භාණ්ඩ ද බලපත්‍රලාභී වාණිජ බැංකුවක අක් වෙරළ ඒකකයන් විසින් දරනු ලබන එවැනි භාණ්ඩ හැරෙන්නට" යන වචන සහ ඉලක්කම් වෙනුවට "බලපත්‍රලාභී වාණිජ බැංකුවක අක්වෙරළ ඒකකයන් විසින් දරනු ලබන එවැනි භාණ්ඩ හැරෙන්නට" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 72 වන වගන්තිය සංශෝධනය කිරීම

**36.** ප්‍රධාන ප්‍රඥප්තියේ 76ඇ වන වගන්තිය, එහි (3) වන උපවගන්තිය ඉවත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 76ඇ වන වගන්තිය සංශෝධනය කිරීම

**37.** ප්‍රධාන ප්‍රඥප්තියේ 76උ වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ "මුදල් මණ්ඩලය විසින් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව," යන වචන වෙනුවට "මහ බැංකුව විසින්" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 76උ වන වගන්තිය සංශෝධනය කිරීම

**38.** ප්‍රධාන ප්‍රඥප්තියේ 76ඌ වන වගන්තිය, එහි "මේ පනතේ V වන" යන වචන සහ ඉලක්කම් වෙනුවට "මේ පනතේ 21 වන වගන්තියේ, V වන" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 76ඌ වන වගන්තිය සංශෝධනය කිරීම

ප්‍රධාන ප්‍රඥප්තියේ 76ඵ වන වගන්තිය සංශෝධනය කිරීම

**39.** ප්‍රධාන ප්‍රඥප්තියේ 76ඵ වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) "බලපත්‍රලාභී විශේෂිත බැංකු වර්ගයකට හෝ" යන වචන වෙනුවට, පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"බලපත්‍රලාභී විශේෂිත බැංකු වර්ගයකට, එකී බැංකුවල වත්කම්වල ප්‍රමාණය, පරිමාණය, විවිධත්වය සහ මෙහෙයුම්වල සංකීර්ණ බව සැලකිල්ලට ගෙන හෝ ඒවායින් එකක් හෝ වැඩි ගණනක් සඳහා ලිඛිතව දක්වනු ලැබිය යුතු හේතූන් මත" පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්"; සහ

(2) එහි (ඔ) වන ඡේදය ඉවත් කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 76ඔ වන වගන්තිය සංශෝධනය කිරීම

**40.** ප්‍රධාන ප්‍රඥප්තියේ 76ඔ වන වගන්තිය, එහි "45 වන වගන්තියේ විධිවිධාන" යන වචන සහ ඉලක්කම් වෙනුවට "45 වන, 47 වන, 48අ වන, 49 වන සහ 49අ වන වගන්තිවල විධිවිධාන" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 76ක වන වගන්තිය සංශෝධනය කිරීම

**41.** ප්‍රධාන ප්‍රඥප්තියේ 76ක වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (3) වන උපවගන්තියේ (ආ) වන ඡේදයේ -

(අ) (i) වන අනුඡේදය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"(i) යම් ලිඛිත නීතියක් මගින් හෝ යටතේ බැංකුව ශ්‍රී ලංකාව තුළ සංස්ථාගත කරන ලද හෝ පිහිටුවන ලද අවස්ථාවක, බැංකුවේ ගණන් බේරා වසා දැමීම සඳහා වන නඩු කටයුතු, ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු ගණන් බේරා වසා දැමීම සඳහා විශේෂයෙන් විධිවිධාන සලස්වන තත්කාලයේ බලපවත්නා යම් ලිඛිත නීතියක විධිවිධාන යටතේ ආරම්භ කරනු ලැබිය යුතු ය;";

(ආ) එහි (ii) වන අනුඡේදය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"(ii) බැංකුව ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කර ඇති අවස්ථාවක, 76අ වන වගන්තිය යටතේ නිකුත් කරන ලද බලපත්‍රය යටතේ බලය ලබා දී ඇති එකී බැංකුවේ ව්‍යාපාර වසා දමනු ලැබිය යුතු අතර, එහි කටයුතු, ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු ගණන් බේරා වසා දැමීම සඳහා විශේෂයෙන් විධිවිධාන සලස්වන, තත්කාලයේ බලපවත්නා යම් ලිඛිත නීතියක විධිවිධාන යටතේ ගණන් බේරා වසා දමනු ලැබිය යුතු ය";.සහ

(2) එහි (3අ) වන, (3ආ) වන, (3ඇ) වන, (3ඈ) වන, (3ඉ) වන, (3ඊ) වන සහ (3උ) වන උපවගන්ති ඉවත් කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 79 වන වගන්තිය සංශෝධනය කිරීම

**42.** ප්‍රධාන ප්‍රඥප්තියේ 79 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ "33 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ, 41 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ" යන වචන සහ ඉලක්කම් වෙනුවට "41 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියට 79ආ වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම

**43.** ප්‍රධාන ප්‍රඥප්තියේ 79අ වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එම ප්‍රඥප්තියේ 79ආ වන වගන්තිය ලෙස බලාත්මක විය යුතු යː-

"මහ බැංකුව විසින් පරිපාලනමය දඩයක් පැනවිය යුතු බව

79ආ. (1) මේ පනතේ හෝ තත්කාලයේ බලපවත්නා වෙනත් යම් ලිඛිත නීතියක යම් විධිවිධානයකට අගතියක් නොමැතිව, කරුණු කියා පෑමට අවස්ථාවක් ලබා දීමෙන් පසුව, මේ පනතේ 12 වන වගන්තියේ (1ඇ), (3) සහ (4) වන උපවගන්තිවල, 19 වන වගන්තියේ, 21 වන වගන්තියේ, 38 වන වගන්තියේ (1) වන උපවගන්තියේ හෝ 46 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) වන ඡේදයේ විධිවිධාන උල්ලංඝනය කරනු ලබන්නේ යම් තැනැත්තකු විසින් ද, එම තැනැත්තාට මහ බැංකුව විසින් පරිපාලනමය දඩයක් පැනවීම නීත්‍යානුකූල වන්නේ ය.

(2) මහ බැංකුව විසින් පරිපාලනමය දඩයක් පැනවීමට නිශ්චය කිරීමේ දී පහත දැක්වෙන කාරණා සැලකිල්ලට ගනු ලැබිය යුතු යː-

(අ) ඒ උල්ලංඝනය කිරීමෙහි බරපතළකම;

(ආ) නැවත නැවත ඒ උල්ලංඝනය කිරීම සිදුවන්නේ ද යන බව;

(ඇ) ඒ උල්ලංඝනය කිරීමෙහි ආනුශංගික ප්‍රතිඵලයක් ලෙස තැන්පත්කරුවන්ට හෝ වෙනත් යම් තැනැත්තකුට යම් පාඩුවක් හෝ හානියක් සිදුවන්නේ ද යන බව;

(ඈ) දඩය පනවනු ලබන්නේ යම් තැනැත්තකුට එරෙහිව ද, එම තැනැත්තා ඒ උල්ලංඝනය කිරීමෙන් අනිසි ප්‍රතිලාභ ලබන්නේ ද යන බව;

(ඉ) එම තැනැත්තාගේ මූල්‍යමය මූලාශ්‍ර;

(ඊ) යම් ලිහිල් කිරීමකට තුඩු දෙන කරුණු; සහ

(උ) අදාළ වන බවට සැළකිය හැකි එවැනි වෙනත් යම් කාරණා.

(3) (1) වන උපවගන්තිය යටතේ යම් තැනැත්තකුට පරිපාලනමය දඩයක් පැනවීමේ කාර්යපටිපාටිය හා ආකාරය කරන ලද උල්ලංඝනයට සමානුපාතිකව සහ එම දඩයේ ප්‍රමාණය, මහ බැංකුව විසින් නිශ්චය කරනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 83අ වන වගන්තිය සංශෝධනය කිරීම

**44.** ප්‍රධාන ප්‍රඥප්තියේ 83අ වන වගන්තියේ "බලපත්‍රලාභී වාණිජ බැංකුවකට" යන වචන වෙනුවට "බලපත්‍රලාභී වාණිජ බැංකුවකට සහ බලපත්‍රලාභී විශේෂිත බැංකුවකට" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියට 83ඈ වන සහ 83ඉ වන අලුත් වගන්ති ඇතුළත් කිරීම

**45.** ප්‍රධාන ප්‍රඥප්තියේ 83ඇ වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් ලබන අතර, එම වගන්ති එම ප්‍රඥප්තියේ 83ඈ වන සහ 83ඉ වන වගන්ති ලෙස බලාත්මක විය යුතු යඃ-

"මහ බැංකුව විසින් එහි බලතල, කාර්ය සහ කර්තව්‍ය පැවරීම

83ඈ. මහ බැංකුව විසින්, අවශ්‍ය යයි සලකනු ලබන්නේ නම්, මේ පනත යටතේ එහි බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සඳහා, අවස්ථාවෝචිත පරිදි, අධිපතිවරයා, නියෝජ්‍ය අධිපතිවරයා, සහකාර අධිපතිවරයා, බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියකුගේ නිලයට පහළ නිලයක් නොවිය යුතු මහ බැංකුවේ වෙනත් යම් නිලධරයකු හෝ මහ බැංකුවේ එකී නිලධරයන්ගෙන් සමන්විත වන යම් කමිටුවක් වෙත, මේ පනත යටතේ මහ බැංකුව සතු එකී යම් බලතල, කාර්ය සහ කර්තව්‍ය කිසිවක් පවරනු ලැබිය හැකි ය.

මහ බැංකුව විසින් යම් තොරතුරු ආදිය සැපයීම සඳහා යම් තැනැත්තකුට දැනුම් දීම

83ඉ. (1) මහ බැංකුව විසින්, ලිඛිත දැන්වීමක් මගින් මේ පනත යටතේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම සඳහා අවශ්‍ය යයි මහ බැංකුව සලකනු ලැබිය හැකි පරිදි සහ එම දැන්වීමේ නිශ්චිතව දක්වා ඇති පරිදි එම කාලසීමාව ඇතුළත එම දැන්වීමෙහි නිශ්චිතව දක්වා ඇති පරිදි යම් තොරතුරක් සපයන ලෙස හෝ යම් ලේඛනයක් ඉදිරිපත් කරන ලෙස, බලපත්‍රලාභී වාණිජ බැංකුවක්, බලපත්‍රලාභී විශේෂිත බැංකුවක්, ඒ බැංකුවේ අධ්‍යක්ෂවරයකු, ප්‍රධාන විධායක නිලධරයා හෝ විධායක කර්තව්‍යයක් ඉටු කරනු ලබන නිලධරයකු හැර, වෙනත් යම් තැනැත්තකු වෙත දැනුම් දෙනු ලැබිය හැකි ය.

(2) වෙනත් යම් ලිඛිත නීතියකට පටහැනිව කුමක් සඳහන් වුව ද, (1) වන උපවගන්තිය යටතේ දැන්වීමක් ලබන යම් තැනැත්තකු විසින් ද, එම දැන්වීමේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාව ඇතුළත දී එම දැන්වීමේ නියමයන්ට අනුකූලව කටයුතු කිරීම එසේ දැන්වීමක් ලද තැනැත්තාගේ කාර්යය වන්නේ ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 86 වන වගන්තිය සංශෝධනය කිරීම

**46.** ප්‍රධාන ප්‍රඥප්තියේ 86 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) "අනුග්‍රහය" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම, පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන්:-

""විගණකාධිපතිවරයා" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 වන ව්‍යවස්ථාව යටතේ පත් කරන ලද විගණකාධිපතිවරයා අදහස් වේ;";

(2) "බැංකු ව්‍යාපාර" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම, පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන්:-

""අර්ථලාභී හිමිකරුවා" යන්නෙන්, යම් සමාගමක ඍජු හෝ වක්‍ර හිමිකාරිත්වය හෝ කොටස් පාලනය කිරීම හෝ ඡන්ද අයිතීන් හෝ වෙනත් හිමිකාරිත්ව සම්බන්ධතාවක් හරහා සම්පූර්ණයෙන් ම හෝ කොටස් වශයෙන් එම සමාගමෙන් සියයට දහයක් හෝ ඊට වඩා වැඩි ප්‍රමාණයක් අවසානයේ දී අයිති වන හෝ පාලනය කරන ස්වභාවික තැනැත්තකු අදහස් වන අතර, එමෙන්ම ඊට වෙනත් ක්‍රම හරහා ඵලදායී පාලනයක් ක්‍රියාත්මක කරන ස්වාභාවික තැනැත්තකු ද ඇතුළත් වේ. අර්ථලාභී හිමිකාරිත්වය ඒ අනුව තේරුම්ගනු ලැබිය යුතු ය;

"ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කරන ලද බලපත්‍රලාභී වාණිජ බැංකුවක ශාඛාවක අධ්‍යක්ෂ මණ්ඩලය" යන්නෙන්, අදාළ ශාඛාව අධීක්ෂණය කරන්නා වූ එම බලපත්‍රලාභී වාණිජ බැංකුවේ ප්‍රධාන කාර්යාලය හෝ ප්‍රාදේශීය කාර්යාලය හෝ එම ශාඛාවේ අධ්‍යක්ෂ මණ්ඩලය වශයෙන් කටයුතු කිරීම සඳහා, අවස්ථාවෝචිත පරිදි, එම ප්‍රධාන කාර්යාලය හෝ ප්‍රාදේශීය කාර්යාලය විසින් කළමනාකරණය අධීක්ෂණය කිරීම සම්බන්ධයෙන් බලතල පවරනු ලැබ ඇති කළමනාකරණ කමිටුවක් අදහස් වේ;";

(3) "ආයතනය" යන අර්ථ නිරූපණයට ඉක්බිතිව ම, පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන්:-

""පාලන සම්බන්ධතාවය" යන්නෙන්, බලපත්‍රලාභී වාණිජ බැංකුවක එක් ණයකරුවකුට ඒ බැංකුවේ වෙනත් ණයකරුවන්ගේ ක්‍රියාකාරකම්වලට බලපෑම් කිරීමට ඇති හැකියාව අදහස් වේ;";

(4) "බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා" යන යෙදුමේ අර්ථ නිරූපණය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

""බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා" යන්නෙන්, ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු නියාමනය සහ අධීක්ෂණය කිරීම භාරව ඇත්තේ මහ බැංකුවේ යම් දෙපාර්තමේන්තුවකට ද, එම දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වන මහ බැංකුවේ සේවානියුක්තකයකු අදහස් වේ;";

(5) "මෙරට බැංකු ව්‍යාපාර කටයුතු" යන යෙදුමේ අර්ථ නිරූපණය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

""ආර්ථික අන්තර් රැඳියාව" යන්නෙන්, යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක එක් ණයකරුවකු ඒ බැංකුවේ වෙනත් යම් ණයකරුවකුගේ ව්‍යාපාරයක් මත රඳාපැවතීම අදහස් වන අතර, එහි දී පසුව සඳහන් කළ තැනැත්තාගේ ආර්ථික අපහසුතා පළමුව සඳහන් කළ ණයකරුවාගේ නැවත ගෙවීමේ හැකියාව අඩු කරනු ලැබිය හැකි ය;

""විගණනය භාර හවුල්කරුවා" යන්නෙන්, විගණනයෙහි යෙදීම සහ එහි කාර්යසාධනය සඳහා වගකිව යුතු සහ ව්‍යාපාර ආයතන වෙනුවෙන් නිකුත් කරන ලද විගණකවරයාගේ වාර්තාව සඳහා වගකිව යුතු සහ අවශ්‍ය අවස්ථාවක දී වෘත්තිමය, නෛතික හෝ නියාමන

මණ්ඩලයකින් නිසි අධිකාරිය සහිත ව්‍යාපාර ආයතනයේ හවුල්කරුවා හෝ වෙනත් තැනැත්තකු අදහස් වේ;

"ගනුදෙනු නිරාවරණය" යන්නෙන්, අනුග්‍රහ මුදල සහ සියලු මූල්‍ය ආයෝජන අදහස් වේ;";

(6) "වාණිජ බැංකුවක ප්‍රධාන කාර්යාලය" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම, පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන්:-

""ජාත්‍යන්තර ප්‍රමිති" යන්නෙන්, බොහෝ රටවලට අයත් විශේෂඥයන්ගේ ඒකමතිකභාවයෙන් වැඩිදියුණු කරන ලද සහ බැංකු අධීක්ෂණය කිරීම පිළිබඳ බාසල් කමිටුව, මූල්‍ය ස්ථායීතා මණ්ඩලය සහ එවැනි වෙනත් සමාන ප්‍රමිති පිහිටුවීමේ ආයතන ඇතුළත්ව ගෝලීය වශයෙන් පිළිගත් ආයතනයක් විසින් පළ කරන ලද මූලධර්ම, මාර්ගෝපදේශ, කාර්යපටිපාටි හෝ ගතිලක්ෂණවලින් සමන්විත ප්‍රමිති අදහස් වේ;";

(7) "පළාත් පාලන ආයතනය" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම, පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන්:-

""අමාත්‍යවරයා" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන හෝ 45 වන ව්‍යවස්ථාව ප්‍රකාරව මුදල් විෂයය පවරන ලද අමාත්‍යවරයා අදහස් වේ;";

(8) "මුදල් මණ්ඩලය" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම, පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන්:-

""මූල්‍ය නොවන පාලිත සමාගම" යන්නෙන්, 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ අර්ථ නිරූපණය කර ඇති පරිදි වූ 'මූල්‍ය ක්ෂේත්‍ර සහභාගීකරු' ගේ ව්‍යාපාර හැර

ව්‍යාපාරය කරගෙන යනු ලබන බලපත්‍රලාභී වාණිජ බැංකුවක හෝ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක පාලිත සමාගමක් අදහස් වේ;";

(9) "අනේවාසිකයා" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම, පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන්:-

""අක්වෙරළ බැංකු ව්‍යාපාර" යන්නෙන්, බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින්, යම් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් අනේවාසිකයන්ට සහ මහ බැංකුව විසින්, කලින් කල, නිශ්චය කරනු ලැබිය හැකි පරිදි ඇතැම් නේවාසිකයන්ට බැංකු ව්‍යාපාර සැපයීම අදහස් වේ;

"භෞතිකව පැවතීම" යන්නෙන්, රට ඇතුළත පිහිටි අර්ථාන්විත මනස සහ කළමනාකාරිත්වය අදහස් වන අතර, ඊට ඒ රටෙහි මෙරට නියෝජිතයකුගේ හෝ පහළ මට්ටමේ කාර්ය මණ්ඩලයකගේ සරල හෝ හුදු පැවැත්ම ඇතුළත් නොවේ;";

(10) "නේවාසිකයා" යන අර්ථ නිරූපණයට ඉක්බිතිව ම, පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන්:-

""කොටස් හිමියා" යන්නෙන්, 2007 අංක 07 දරන සමාගම් පනතෙන් ඊට දී ඇති අර්ථය ම තිබිය යුතු ය;

"ෂෙල් බැංකුව" යන්නෙන්, සංස්ථාගත කරන ලද සහ බලපත්‍රය ලබාගත් රටෙහි කිසිදු භෞතික පැවතීමක් නොමැති සහ ඵලදායී ඒකාබද්ධිත අධීක්ෂණයට යටත් වන මූල්‍ය කණ්ඩායමක් සමඟ අනුබද්ධිත නොවන බැංකුවක් අදහස් වේ;";

(11) "සැහෙන සම්බන්ධතාවක්" යන යෙදුමේ අර්ථ නිරූපණයේ "හානිපූර්ණයක් අදහස් වේ." යන වචන වෙනුවට "හානිපූරණයක් අදහස් වේ;" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(12) "සැහෙන සම්බන්ධතාවක්" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අර්ථ නිරූපණය එකතු කිරීමෙන්:-

""නීති විරෝධී ක්‍රියාකාරකම" යන්නෙන්, 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනතේ ඊට දී ඇති අර්ථයම තිබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ II වන උපලේඛනය සංශෝධනය කිරීම

**47.** ප්‍රධාන ප්‍රඥප්තියේ II වන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (ය) වන අයිතමයේ "භාණ්ඩ මිලට ගැනීම." යන වචන වෙනුවට "භාණ්ඩ මිලට ගැනීම;" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) (ය) වන අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස එකතු කිරීමෙන්:-

"(අඅ) අක්වෙරළ බැංකු ව්‍යාපාර සිදු කිරීම.".

76ක වන වගන්තිය යටතේ මුදල් මණ්ඩලය විසින් සකසන ලද යෝජනාක්‍රමවලට අදාළ විශේෂ විධිවිධාන

**48.** මේ පනත මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 76ක වන වගන්තියේ (3ඇ) වන උපවගන්තිය ඉවත් කිරීම නොසලකා හරිමින්, එම වගන්තියේ (3ඇ) වන උපවගන්තිය යටතේ මුදල් මණ්ඩලය විසින් සකසන ලද යම් යෝජනා ක්‍රමයක නියම සහ කොන්දේසි ප්‍රකාරව එම උපවගන්තියේ දක්වා ඇති ගෙවීම් පැහැර හරින ලද බැංකුවේ තැන්පත්කරුවන්ගේ සහ ණය හිමියන්ගේ වගකීම් සම්පූර්ණයෙන් ගෙවා නිරාකරණය කරනු ලබන තෙක්, අඛණ්ඩව බලාත්මකව පැවතිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**49.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.